

# 2023

# වාර්ෂික වාර්තාව
# ANNUAL REPORT

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
## EHELIYAGODA PRADESHIYA SABHA


0362258012/
0362258014

ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ

ehelips@gmail.com

Eheliyagoda
Pradeshiya Sabha



සපිරි පුරවරය

# වාර්ෂික වාර්තාව - 2023


## 01
**හැඳින්වීම**
01. අප ගැන
02. අහැලියගොඩ සැකවින්
03. අපගේ සේවා
04. දැක්ම, මෙහෙවර හා වටිනාකම්
05. අපගේ අරමුණු

## 02
**මූල්‍ය තොරතුරු**
01. මූල්‍ය කාර්ය සාධනය
02. ආදායම් විශ්ලේෂණය
03. වියදම් විශ්ලේෂණය
04. වත්කම්, වගකීම් හා හිමිකම

## 03
**සභා කටයුතු**
01. ලේකම් තුමාගේ පනිවිඩය
02. අපගේ මහ සභාව
03. සංවිධාන සටහන

## 04
**ආයතනික කාර්ය සාධනය**
01. පොදු පරිපාලනය
02. සෞඛ්‍ය සේවා
03. භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි
04. ජල සේවා
05. මහජන උපයෝගී සේවා
06. සුභ සාධන සේවා

## 05
**යහපාලනය**
01. යහපාලන සංවිධාන ව්‍යුහය
02. යහපාලන ක්‍රියාකාරකම්
03. ආයතනික සමාජ වගකීම
04. තිරසර සංවර්ධන ඉලක්ක ලගාකර ගැනීම සඳහා අපගේ කැපවීම

## 06
**අපගේ ජයග්‍රහණ**

## 07.
**මූල්‍ය වාර්තා**
01. විගණකාධිපති වාර්තාව
02. ආදායම් වියදම් ගිණුම
03. ගිණුම්කරණ ප්‍රතිපත්ති
04. මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය/මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
05. ගිණුම්කරණ සටහන්
06. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
07. ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය

**01. හැඳින්වීම**

01. අප ගැන
02. අහැලියගොඩ සැකවින්
03. අපගේ සේවා
04. දැක්ම, මෙහෙවර හා වටිනාකම්
05. අපගේ අරමුණු



මදරසිංහාරාමය පුරාණ විහාරය

## ඇහැලියගොඩින් බිඳක්

### භූ විෂමතාවය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය කඳු හෙල් හා උස් බෑවුම්වලින් යුක්ත වේ. මෙම බල ප්‍රදේශයේ බටහිර දිගින් පිහිටි කරදන,කලටුවාව,වෑවිල යන ප්‍රදේශ කඳු සහිත ය. උස මුහුදු මට්ටමේ සිට අඩි 800-1200 ක් අතර වේ.

### දේශගුණය

සාමාන්‍යයෙන් තෙත් කලාපීය දේශගුණයකින් යුත් මෙම ප්‍රදේශයට මැයි,අගෝස්තු කාලයේ නිරිත දිග මෝසම් සුළං මගින් හා නොවැම්බර්,පෙබරවාරි කාලය තුල ඊසාන දිග මෝසම් සුළං මගින් වර්ෂාපතනය ලැබේ. එම වර්ෂාපතනය හේතුවෙන් වර්ෂය පුරාම සෞම්‍ය දේශගුණයකට හිමිකම් කියයි.

### පස් වර්ග

ශ්‍රී ලංකාවේ පස් වර්ගීකරණය අනුව මෙම බල ප්‍රදේශයේ රත් කහ පොඩ්සොලික් නම් පස් වර්ග බහුල වශයෙන් ඇති බව තහවුරු වී ඇත.මේ හැර රත් පස්, දුඹුරු පස්, බොරළු පස්, දියළු පස් ද මද වශයෙන් දැකිය හැකි ය.

### භූමි පරිහරණය හා ඉඩම් භුක්තිය

මෙහි වැඩි වශයෙන් කෘෂි කර්මාන්තය මෙන්ම රබර් වගාවද දැකිය හැකි අතර තේ, පොල්, කුරුඳු වගාව ද ඒ අතර වේ. වී ගොවිතැන වැඩි වශයෙන් කෙරෙන්නේ අඳ ගොවි ක්‍රමයට වන අතර තට්ටු මාරු ක්‍රමයට තමන්ගේ කුඹුරු වගා කරන්නෝද වෙති. එසේම ප්‍රදේශවාසීන්ගෙන් වැඩි කොටසක් පරම්පරා ඉඩම් භුක්තියට හිමිකම් කියන අතර රජය මගින් ලබා දුන් ඉඩම්වලද පදිංචි වී සිටිති.

## ඓතිහාසික පසුබිම

ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විමසා බැලීමේ දී නොයෙකුත් ජනප්‍රවාද රාශියකින් යුක්තවේ. එහි ඉතිහාසය සීතාවක රාජසිංහ සමයේ රජ කල 11 වන රාජසිංහ රජ සමය දක්වා දිවයයි.පළමු රාජසිංහ රජු නිතර වෙස් වලාගෙන සාමාන්‍ය මිනිසෙකු ලෙස රටපුරා ඇවිද රට වැසියන්ගේ දුක සැප සොයා බලා පිළියම් යෙදූ අභීත වීර පුරුෂයෙකු ලෙස ප්‍රචලිත ය.

මෙසේ එක් දිනක් රට වැසියන්ගේ දුක සැප විචාරමින් විදි සංචාරය කරන විට රෑ බෝ වූ බැවින් රාත්‍රී කාලය ගත කිරීමට සුදුසු ස්ථානයක් සොයා ගෙන යන අවස්ථාවේදී ඇහැල මලී නමින් හැදින්වූ රූමත් කාන්තාවකගේ නිවසේ රාත්‍රිය ගත කර ඇත .රජතුමාට ඉහලින් ගරු සත්කාර කල මේ කාන්තාව කෙරෙහි පැහැදුන රජතුමා මේ ප්‍රදේශය ඇහැලිගේ ගොඩැල්ල ඇහැලියගොඩ වූ බව පැරැන්නන්ගේ මතයයි.

ඇහැලියගොඩ යන නම නිර්මාණය වූ තවත් එක් මතයක් නම් අතීතයේ මේ ප්‍රදේශය ඇහැලමලී නමින් හැදින්වූ කාන්තාවක් ජීවනෝපාය ලෙසින් රෙදි සේදීම තම වෘත්තිය කොට ගෙන ජීවත් වූ කාලෙක දුර ගමන් විඩාව සංසිදුවා ගැනිම සදහා මෙම ස්ථානය නවාතැනක් ලෙස භාවිතා කොට ඇත.මෙම ස්ථානය පසුකලෙක ඇහැලිගේ ගොඩැල්ල ඇහැලියගොඩ වූ බව ජනප්‍රවාදයේ කියවේ.

**අපගේ සභාව**

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් සභාව වශයෙන් පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව උතුරින් කොළඹ ද බටහිරින් කළුතර ද නැගෙනහිරින් කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් ද දකුණින් කුරුවිට ප්‍රාදේශීය සභා සීමාවෙන් ද වෙන්ව පවතී.

ව.කී.මීටර් 139 ක් පුරා ව්‍යාප්තව පවතින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරි වසම් 44 කින් යුක්ත වේ. 1947 ට පෙර මෙම ප්‍රදේශය අයත් වූයේ කුඩා නගර සෞඛ්‍ය ආරක්ෂණ සභා පණත යටතේ සෞඛ්‍ය ආරක්ෂණ සභාවටය.

එවකට පළාත් පාලන ඇමැතිව සිටි එස්.ඩබ්.ආර්. ඩී.බණ්ඩාරනායක මැතිතුමන් 1947 ජනවාරි 01 දින තම අත්සනින් යුතුව නිකුත් කරන ලද එල්.ටී.බී/43 පී33/1/42 දරණ චක්‍රෙල්ඛය අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ කොටසක් එක්ව පවත්වාගෙන ගිය කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව ගම් සභා පණතට ගෙන ඇත.

ඒ අනුව එහි සෞඛ්‍ය ආරක්ෂණ සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් කොටස පනාවල හා අටුළුගම් කෝරළේ ගම් කාර්ය සභාවට ද,රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොටස කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් කාර්ය සභාව ලෙසද නම්කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු.ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ධූර කාලයේ පරිපාලන හා සංවර්ධන කටයුතුවලට අදාලව තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජනතාවට පළාත් මට්ටමින් ඵලදායි දෙස සහභාගිවීම හා වැඩි අවස්ථාවක් සලසා දිමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා ද එම සභාවේ බලතල හා කාර්යයන් හා කර්තව්‍යයන් විනිශ්චය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ අනුසාංගික සියළු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණත 1987 අප්‍රේල් 16 දින ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව 1991.07.01 දින සිට අහැලියගොඩ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය විය.

මේ අනුව 1931.සිට 1948 දක්වා කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව මගින්ද, 1948 සිට 1977 දක්වා කුරුවිට කෝරලේ පල්ලෙ පත්තු ගම් සභෟව මගින් ද, 1977 සිට 1991.06.31 දක්වා විශේෂ කොමසාරිස් වරයෙකු යටතේද, 1991.07.01 දින සිට 2023.03.19 දක්වා ප්‍රාදේශීය සභා සභාපතිවරුන් යටතේ ද 2023.03.20 දින සිට මේ දක්වා ප්‍රාදේශීය සභා ලේකම්වරුන් යටතේ පාලනය වෙමින් පවතී.

## ආයතනය සතු සම්පත්

### වාහන



02



01



01



02



01




01



04





සේවා ආයතන
ආදාහනාගාර - 01
ආයුර්වේද බෙහෙත් ශාලා - 03
පුස්තකාල - 04
පෙර පාසැල් - 03
කියවීම් ශාලා - 04



## බදු ඒකක

- නිවාස - 3889
- රාජ්‍ය ආයතන - 28
- වරිපනම් ඒකක - 6289
- මස්කඩ - 03
- ධීවර සංස්ථාව සතු කඩ කාමර - 01
- කඩ කාමර - 61
- සතිපොළ ගණන - 03
- වෙළඳ බලපත්‍ර ඒකක - 560
- ආගමික ස්ථාන - 25
- ව්‍යාපාර ස්ථාන - 1412
- ඉඩම් - 935
- ව්‍යාපාර බදු ඒකක - 396
- කමර්ාන්ත බදු ඒකක - 35
- අක්කර බදු ඒකක - 340




ආයතනය සතු මානව සම්පත
සේවයේ යෙදී සිටින කාර්‍ය මණ්ඩලය - 79
පුරප්පාඩු - 11
කොන්ත්‍රාත් පදනමින් - 15
අතිරික්ත - 04 (සංවර්ධන නිලධාරි)
අනුමත කාර්‍ය මණ්ඩලය - 87






## සේවා ස්ථාන

- රැස්වීම් ශාලා - 03
- ජල ව්‍යාපෘති - 02
- සුසාන භූමි - 11
- කසල අංගන - 02
- ප්‍රජා මණ්ඩල - 10
- ක්‍රීඩා පිටි උද්‍යාන - 02
- කියවීම් ශාලා - 04
- පොදු ළිං - 58



## අපගේ සේවා

### පොදු පරිපාලන කටයුතු

ආයතනයේ සේවය කරන සියළුම නිලධාරීන්ගේ හා සේවකයින් තම කාර්යභාරය කාර්යක්ෂම හා අනලස්ව ඉටු කරමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවට අනගි සේවයක් ඉටු කිරීම සඳහා විනිවිධ භාවයෙන් යුක්තව මූල්‍ය කළමනාකරණය කර ආදායම් ඒකරාශි කිරීමත්,ස්වයං උත්පාදන ආදායම් වැඩි කර ගැනීමත් මෙමගින් සිදු වේ.

**කාර්යයන්**

- සාමාන්‍ය පරිපාලන කටයුතු
- මූල්‍ය කටයුතු
- ආදයම් තක්සේරුව හා ඒකරාශිකරණය
- අභ්‍යන්තර විගණනය
- පුහුණු කිරීම්

### සෞඛ්‍ය කටයුතු

කසලවලින් තොර දැකුම්කළු නගරයක් බවට අහැළියගොඩ නගරය පත්කිරීමටත්,සභාබල ප්‍රදේශයේ මහජනතාවගේ සෞඛ්‍ය නගා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.

**කාර්යයන්**

- සාමාන්‍ය පරිපාලන කටයුතු
- රෝග වැලැක්වීමේ කටයුතු
- ආයුර්වේද වෛද්‍ය පහසුකම්
- ආහාර පර්යේෂණ කටයුතු
- කාණු පිරිසිදු කිරීම
- සෞඛ්‍ය අධ්‍යාපනය
- මාතෘ හා ළදරු සෞඛ්‍ය
- ඝණ අපද්‍රව්‍ය කලමනාකරණය
- පරිසර සංරක්ෂණ කටයුතු
- රුක්රෝපණ වැඩසටහන්
- ඩෙංගු නිවාරණ වැඩසටහන්
- දුම්වැටි හා මත්ද්‍රව්‍ය වැඩසටහන්

## භෞතික කැලසුම් කිරීම, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු

ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මංමාවත්,පාලම් හා බෝක්කු කාණු ඉදිකිරීම හා නඩත්තු කරමින් මහජනතාවට මාර්ග පහසුකම් සැලසීමටත්, සැලසුම් සහගත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමත්, මෙමගින් සිදු කෙරේ.

**කාර්යයන්**

- සාමාන්‍ය පරිපාලනය
- මාර්ග,පාලම්,බෝක්කු,කාණු ඉදි කිරීම හා නඩත්තුව
- ඉඩම් ගොඩනැගිලි සංවර්ධනය කිරීම හා නඩත්තුව

## ජල සේවා

ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා අනෙකුත් ජල අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු ළිං, ජල කරාම, ජල ව්‍යාපෘති නඩත්තු කිරීම ඉදිකිරීම සැලසුම් කිරීම හා වියළි කාලයේ ජල බවුසර් මගින් ජලය බෙදා හැරීම මෙමගින් සිදු කෙරේ.

**කාර්යයන්**

- සාමාන්‍ය පරිපාලනය
- පොදු ළිං,ජල කරාම,ජල ව්‍යාපෘති නඩත්තු කිරීම
- පොදු ළිං ,ජල කරාම,ජල ව්‍යාපෘති ඉදි කිරීම
- වියළි කාලයේ ජල බවුසර් මගින් ජලය බෙදා හැරීම
- පොදු ආවශ්‍යක සේවා කටයුතු


## පොදු ආවශ්‍යක සේවා කටයුතු


ප්‍රදේශයේ මහජනතාවගේ පොදු අවශ්‍යතාවයන් සඳහා පොදු වෙළඳ පොළවල් ඉදිකිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම හා මහජනතාවගේ සුබ විහරණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර පවත්වාගෙන යාමට අවශ්‍ය පොදු පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.

**කාර්යයන්**

- සාමාන්‍ය පරිපාලනය
- පුස්තකාල පහසුකම් සැපයීම
- ක්‍රීඩාපිටි හා උද්‍යාන පවත්වාගෙන යාම
- පෙරපාසැල් පවත්වාගෙන යාම
- මහජන ආධාර හා සහන සැලසීම

# ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය




සභා බල
ප්‍රදේශයේ
සමාජ පසුබිම
මන්ත්‍රී
කොට්ඨාශ -
18
නාගරික බල
ප්‍රදේශය
ව.කි.මී.16.69
ග්‍රාම
නිලධාරි
වසම් - 44
ජනගහනය
- 80452
භූමි
ප්‍රමාණය
ව.කි.මී.139


ඇහැළියගොඩ
ප්‍රාදේශීය සභාව
எஹெலியகொட
பிரதேச
EHELIYAGODA
PRADESHIYA SABHA

**දැක්ම**

- ජනතා සේවය තුලින් සපිරි පුරවරයක් කරා

**මෙහෙවර**

- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන්ට සහ මාගර් පහසුකම් සැපයීම ද, ජනතාවගේ සුබ විහරණය හා සුභ සාධන පහසුකම් ආරක්ෂා කිරීම ද, අදාළ සියළු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ද, ආයතනයේ ප්‍රමුඛ මෙහෙවරක් වේ.

**අපගේ ප්‍රධාන අරමුණ**

- ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය නංවාලිම හා එය විශිෂ්ට අන්දමින් පවත්වාගන යාම.

**කාර්යක්ෂම තාවය**

- මහජනතාව කෙරෙහි විශිෂ්ඨ, කඩිනම්, අප්‍රමාදී සේවාවක් සැපයීම.

**විනිවිදභාවය**

- විශ්වසනීය හා සත්‍යතාවය මහජනතාවට අවබෝධ කිරීමේ හැකියාව.

**වගවීම**

- මහජනතාව වෙනුවෙන් ලබාදෙන නිරවුල් කායර්ක්ෂම සේවාව පිළිබද තහවුරුවීම.



**02. මූල්‍ය තොරතුරු**

01. මූල්‍ය කාර්ය සාධනය

02. ආදායම් විශ්ලේෂණය

03. වියදම් විශ්ලේෂණය

04. වත්කම්, වගකීම් හා හිමිකම්

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

| විස්තරය | සටහන | 2023.12.31 දිනට | 2022.12.31.දිනට |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය පුනරාවර්තන | 1 | 45,598,444.04 | 51,667,214.14 |
| වෙනත් අයභාර | 2 | 83,712,296.36 | 37,927,273.08 |
| | | **129,310,740.40** | **89,594,487.22** |
| **මෙහෙයුම් වියදම** | | | |
| පුනරාවර්තන වියදම | 3 | 91,726,783.12 | 87,523,679.61 |
| | | **91,726,783.12** | **87,523,679.61** |
| | | | |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 3,034,289.01 | 13,659,974.09 |
| | | **3,034,289.01** | **13,659,974.09** |
| | | | |
| ප්‍රාග්ධන වියදම | 5 | 10,909,880.71 | 14,739,766.85 |
| | | **10,909,880.71** | **14,739,766.85** |
| | | | |
| **වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය** | | **29,708,365.58** | **991,014.85** |

## 2023 .12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ | 6 | 167,339,332.30 | 163,843,403.50 |
| එකතුව | | **167,339,332.30** | **163,843,403.50** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 7 | 872,963.09 | 1,378,713.96 |
| සේවක ණය | 8 | 13,955,786.46 | 10,604,829.80 |
| ලැබියයුතු දෑ | 9 | 156,254,178.34 | 138,273,113.81 |
| ආයෝජන | 10 | 38,985,076.35 | 26,926,366.82 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 29,983,438.14 | 20,590,836.72 |
| **එකතුව** | | **240,051,442.38** | **197,773,861.11** |
| **මුළු වත්කම්** | | **407,390,774.68** | **361,617,264.61** |
| | | | |
| | | | |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 13,462,037.80 | 8,412,586.74 |
| ජංගම වගකීම් | 13 | 21,725,463.30 | 23,537,649.43 |
| හිමිකම් | 14 | **372,203,273.58** | **329,667,028.44** |
| **මුළු හිමිකම්** | | **407,390,774.68** | **361,617,264.61** |

## ආදායම් විශ්ලේෂණය

### වරිපනම් හා බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කල ගම් ප්‍රදේශ වශයෙන් නම් කර ඇති ව.කි.මීටර් 16.69 ක් වන නගර සභා සීමාව තුල වරිපනම් බදු අය කරනු ලබයි. 2012 වර්ෂයේ තක්සේරු වටිනාකම මත මුළු දේපළ වටිනාකමින් 10% ක ප්‍රතිශතයක් ලෙස මුදල් අය කරනු ලබයි.වරිපනම් බදු ඒකක 6562 ක් වන අතර රාජ්‍ය ආයතන,ආගමික ස්ථාන මෙයට ඇතුලත් වේ.

ප්‍රදේශයේ සංචාරක අමාත්‍යාංශයේ ලියා පදිංචි වී ඇති ව්‍යාපාරවලින් 1% ක බද්දක් කරනු ලබයි.හෙක්ටයාර් 01 කට වඩා වැඩි ඉඩම්වලින් රු.50 ක අක්කර බදු මුදලක් අයකරනු ලබයි.


විනෝද බදු ආඥා පණතට අනුව සභා බල ප්‍රදේශයේ විනෝද උත්සව වලින් 15% ක ප්‍රතිශතයක් මත විනෝද බදු අයකරනු ලබයි.

මේ අනුව වරිපනම් හා බදු ආදායම යටතට වරිපනම් බදු,අක්කර බදු,ව්‍යාපාර බදු,කර්මාන්ත බදු,විනෝද බදු ඇතුලත් වේ.

2022 වර්ෂයේ ඇස්තමේන්තු මුදලට වඩා 2023 වර්ෂයේ ඇස්තමේන්තු මුදල වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

එයට හේතු වී ඇත්තේ 2023 වර්ෂයේ කර්මාන්ත බදු,ව්‍යාපාර බදු,ඉඩම් විකිණීම මත බදු,ජල බදු හා විනෝද බදුවල වැඩිවීමක් බව සඳහන් කරමි.


මෙම නිසා 2023 වර්ෂයේ සත්‍ය ආදායම 2022 වර්ෂයේ සත්‍ය ආදායමට වඩා වැඩිවී ඇති බව පහත ප්‍රස්ථාර මගින් පෙන්වා දෙමි.




## සමස්ත ආදායම්

වරිපනම් හා බදු සමග 2021 සිට 2023 දක්වා සමස්ත ආදායම ප්‍රස්ථාර මගින් පහත දක්වමි.


| | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුව | ලැබීම් | ඇස්තමේන්තුව | ලැබීම් | ඇස්තමේන්තුව | ලැබීම් |
| 10.වරිපනම් හා බදු | 8,641,200.00 | 8,630,285.04 | 8,562,500.00 | 10,595,823.08 | 10,029,000.00 | 11,816,630.78 |
| 20.කුලී | 1,169,900.00 | 9,737,897.00 | 12,107,800.00 | 11,873,165.86 | 11,652,500.00 | 12,088,896.09 |
| 30.බලපත්‍ර ගාස්තු | 874,000.00 | 751,567.00 | 1,072,600.00 | 725,134.50 | 1,257,600.00 | 936,780.00 |
| 40.සේවා සඳහා ගාස්තු | 1,695,100.00 | 1,003,088.00 | 2,013,000.00 | 1,989,743.48 | 3,369,500.00 | 2,345,964.43 |
| 50.වරෙන්තු ගාස්තු හා දඩ | 7,832,100.00 | 8,686,928.65 | 7,922,100.00 | 9,145,324.49 | 8,225,100.00 | 757,342.03 |
| 60.වෙනත් ආදායම් | 20,130,900.00 | 20,258,299.38 | 22,443,200.00 | 3,598,081.67 | 35,831,500.00 | 45,964,437.22 |
| 70.ආදායම් ආධාර | 45,358,300.00 | 42,924,232.10 | 50,337,200.00 | 51,667,214.14 | 58,471.700.00 | 46,032,799.75 |
| 80.මූලධන ආධාර | 11,500.000.00 | 26,900,810.60 | 11,501,000.00 | 13,659,974.09 | 15,000,000.00 | 2,738,184.28 |
| **එකතුව** | **107,701,500.00** | **118,893,107.77** | **11,5958,400.00** | **103,254,461.31** | **142,738,900.00** | **122,681,034.58** |







## 2021 - 2023 දක්වා වියදම් විශ්ලේෂණය

| | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|
| විස්තරය | ඇස්තමෙන්තුව | වියදම | ඇස්තමේන්තුව | වියදම | ඇස්තමේන්තුව | වියදම |
| 01 වැටුප් හා වේතන | 60,306,100.00 | 53,951,755.13 | 67,101,400.00 | 64,191,252.95 | 73,685,600 | 58,640,867.27 |
| 02 ගමන් වියදම් | 1,076,200.00 | 542,703.20 | 881,500.00 | 860,348.99 | 1,180,500 | 16,536,11.5 |
| 03සැලසුම් හා උපකරණ | 8,899,100.00 | 6,148,930.08 | 9,595,300.00 | 11,582,376.92 | 15,395,100 | 13,222,802.57 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 7,265,000.00 | 4,290,031.17 | 8,715,000.00 | 4,035,111.45 | 12,729,000 | 7,887,937.41 |
| 05ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් අවශ්‍යතා | 9,124,900.00 | 3,989,969.99 | 7,588,200.00 | 4,321,800.45 | 8,253,200 | 7,532,977.06 |
| 06පොලී ගෙවීම ලාභාංශ හා ප්‍රසාද මුදල් | 1,022,700.00 | 1,094,606.44 | 987,100.00 | 986,919.30 | 996,400 | 948,211.1 |
| 7ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 2,158,100.00 | 1,038,420.64 | 2,205,300.00 | 455,649.55 | 2,510,400 | 703,161.21 |
| 08විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා දායක මුදල් | 1,307,100.00 | 952,921.81 | 1,559,000.00 | 1,090,220.00 | 1,288,400 | 1,137,215 |
| පුනරාවතර්න වියදම් එකතුව | **91,159,200.00** | **72,009,338.46** | **98,632,800.00** | **87,523,679.61** | **11,6038,600** | **91,726,783.1** |
| 9 නව උපකරණ වැය ඉඩම් සංවධර්න හා ගොඩනැගිලි | 4402000.00 | 7,437,356.30 | 5,150,000.00 | 1,403,684.97 | 11,060,000 | 37,583,957.28 |
| මූලධන වියදම් | 11,500,000.00 | 23,928,168.07 | 11,500,000.00 | 13,336,081.88 | 1,5000,000 | 10,909,880.71 |
| 10 ණය ආපසු ගෙවීම් | 607,500.00 | | 675,400.00 | | 640,000 | |
| **මුළු වියදම් එකතුව** | **107,701,200.00** | **103,374,862.83** | **115,958,200.00** | **102,263,446.46** | **142,738,600** | **102,636,663.83** |




## 2023 වර්ෂයේ පුනරාවර්තන  වියදම් වර්ගීකරණය



## වත්කම්, වගකීම් හා හිමිකම්

### වත්කම්

2023.12.31 දිනට ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ වත්කම්වල වටිනාකම රු.167,339,332.30 කි.ඊට අදාල සාරාංශය පහත දැක්වේ.

| විස්තරය | මුදල රු. |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 58,719,477.91 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 64,948,575.12 |
| මෝටර් රථ හා කරත්ත | 33,749,761.68 |
| ලී බඩු හා සවිකිරීම් | 4,223,768.45 |
| පුස්තකාල පොත් | 5,697,749.14 |
| **එකතුව** | **167,339,332.30** |

### වගකීම්

2023.12.31 දිනට ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ වගකීම් රු.35,187,501.10 ඊට අදාළ සාරාංශය පහත දැක්වේ.යටිතල සංවර්ධනය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලෙහි වාරික ගෙවීම හා අනෙකුත් සැපයුම්කරුවන්ට ගෙවීම සඳහා වෙන්කරන ලද මුදල් මෙහි ඇතුළත් වේ.


| විස්තරය | මුදල රු. |
|---|---|
| දේශීය ණය සංවධර්න අර මුදල | 13,462,037.80 |
| ආපසු ගෙවියයුතු සේවක ඇප තැන්පත් | 485,076.35 |
| වියදම් ණය හිමියෝ | 15,331,950.88 |
| පුස්තකාල තැන්පත් | 67,425.00 |
| විවධ තැන්පත් | 5,122,722.84 |
| කලින් ලද ආදායම් | 7,182,888.23 |
| **එකතුව** | **35,187,501.10** |

## හිමිකම්

පසුගිය වසර 05 ක හිමිකම් වෙනස්වීම් පහත වගුව මගින් විස්තර ඇත.

| වර්ෂය | මුදල රු. |
|---|---|
| 2019 | 297,878,917.35 |
| 2020 | 297,726,752.49 |
| 2021 | 340,387,890.30 |
| 2022 | 329,667,028.44 |
| 2023 | 372,203,273.58 |

2023 වර්ෂයේ දී ආදායම් ඇස්තමේන්තුවල වෙනසක් නොවුන ද, ආර්ථිකයේ සිදු වූ විශාල වෙනස්වීම් හේතුවෙන් භාණ්ඩවල මිළ උච්ඡාවචනය වීම තුලින් අය-වැයට බලපෑමක් වුව ද, ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හා ප්‍රාදේශීය සභා විසුරුවා හැරීමත්, නිසා ඒ සඳහා යන වියදම පියවා ගැනීමට හැකි වූ අතර මුද්දර ගාස්තු හා උසාවි දඩ පෙර වර්ෂවල ද ඒවා සමග ලැබීම නිසා 2022 වර්ෂයට වඩා 2023 වර්ෂයේ හිමිකම්වල වැඩිවීමක් පෙන්නුම් කරයි.



**03. සභා කටයුතු**

01. ලේකම් පතිවිඩය

02. අපගේ මහ සභාව

03. සංවිධාන සටහන



ශ්‍රී මුරුගන් හින්දු කෝවිල

## ලේකම් තුමාගේ පණිවිඩය



1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පවුල් 20909 ක් සිටින අතර ප්‍රාදේශීය සභාව ඔවුන්ගේ අභිලාශයන් ඉටු කිරීමට බැඳී සිටී.අපගේ දැක්ම අනුව 2023 වර්ෂයේ අප විසින් කරන ලද ජනතා මෙහෙවර සාර්ථක ප්‍රතිඵල ලැබෙන අයුරින් ක්‍රියාත්මක කිරීමට හැකි විය.මේ සියළු කාර්යන් ඉටු කිරිම සඳහා සභාවට බදු ගෙවන ජනතාවගේ මුදල් සේවා ලබා ගැණීමට පැමිණෙන අය විසින් ගෙවනු ලැබූ සේවා ගාස්තු ආධායම් ආධාර බලපත්‍ර ගාස්තු වරෙන්තු ගාස්තු හා දඩ මුදල් හා මුද්දර ගාස්තු ආදායම් ඉවහල් විය.ප්‍රෙද්ශයට විශාල අඩුවක්ව පැවතුණ ආදාහනාගාරය මෙම වර්ෂයේදී ජනතා අයිතියට පත් කෙරිණි.ඊට අමතරව ප්‍රධාන සතිපොළ භූමිය තුළ ප්‍රධාන බස් නැවතුම්පල හා රථ වාහන ගාල් කිරීමේ අංගනයක් ද පටන් ගතිමි.

ඒ අනුව 2023 වාර්ෂික වාර්තාව උපරිම අයුරින් පත් කිරිමට අවශ්‍ය සහයෝගය ලබා දුන් ප්‍රධාන අමාත්‍යංශයේ ලේකම් තුමියටත් පළාත් පාලන කොමසාරිස් තුමන්ටත් සහකාර පළත් පාලන කොමසාරිස් තුමාටත් පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ සියළු නිලධාරී මහත්ම මහත්මින්ටත් විවිධ උපදෙස් ලබා දෙමින් දිරිමත් කළ ප්‍රාදේශීය දේශපාලන අධිකාරියටත් ඉහළ රාජ්‍ය නිලධාරීන්ටත් නන් අයුරින් සහයෝගය දැක් වූ කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන් හා සේවක මහත්ම මහත්මීන් වෙත මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමි.

ලේකම්
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

## අපගේ මහ සභාව

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් සභාව වශයෙන් පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව උතුරින් කොළඹ ද බටහිරින් කළුතර ද නැගෙනහිරින් කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් ද දකුණින් කුරුවිට ප්‍රාදේශීය සභා සීමාවෙන් ද වෙන්ව පවතී.

ව.කී.මීටර් 139 ක් පුරා ව්‍යාප්තව පවතින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරි වසම් 44 කින් යුක්ත වේ. 1947 ට පෙර මෙම ප්‍රදේශය අයත් වූයේ කුඩා නගර සෞඛ්‍ය ආරක්ෂණ සභා පණත යටතේ සෞඛ්‍ය ආරක්ෂණ සභාවටය.


එවකට පළාත් පාලන ඇමැතිව සිටි එස්.ඩබ්.ආර්. ඩී.බණ්ඩාරනායක මැතිතුමන් 1947 ජනවාරි 01 දින තම අත්සනින් යුතුව නිකුත් කරන ලද එල්.ටී.බී/43 පී33/1/42 දරණ චක්‍රෙල්බය අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ කොටසක් එක්ව පවත්වාගෙන ගිය කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව ගම් සභා පණතට ගෙන ඇත.

ඒ අනුව එහි සෞඛ්‍ය ආරක්ෂණ සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් කොටස පනාවල හා අටුළුගම් කෝරළේ ගම් කාර්ය සභාවට ද,රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොටස කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් කාර්ය සභාව ලෙසද නම්කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු.ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ධූර කාලයේ පරිපාලන හා සංවර්ධන කටයුතුවලට අදාලව තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජනතාවට පළාත් මට්ටමින් ඵලදායි දෙස සහභාගිවීම හා වැඩි අවස්ථාවක් සලසා දිමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා ද එම සභාවේ බලතල හා කාර්යයන් හා කර්තව්‍යයන් විනිශ්චය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ අනුසාංගික සියළු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණත 1987 අප්‍රේල් 16 දින ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව 1991.07.01 දින සිට අහැලියගොඩ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය විය.

මේ අනුව 1931.සිට 1948 දක්වා කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව මගින්ද,1948 සිට 1977 දක්වා කුරුවිට කෝරලේ පල්ලෙ පත්තු ගම් සභාව මගින් ද,1977 සිට 1991.06.31 දක්වා විශේෂ කොමසාරිස් වරයෙකු යටතේද,1991.07.01 දින සිට 2015.05.15 දක්වා ප්‍රාදේශීය සභා සභාපතිවරුන් යටතේ ද 2015 03.16 සිට 2018.03.19 දක්වා විශේෂ කොමසාරිස් යටතේ ද,2018.03.20 දින සිට 2023.03.19 දක්වා සභාපතිවරුන් යටතේ ද,2023 03.20 දින සිට මේ දක්වා ප්‍රාදේශීය සභා ලේකම්වරුන් යටතේ පාලනය වෙමින් පවතී.

## සංවිධාන ව්‍යුහය



සභාව
කමිටු
මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව
ප්‍රසම්පාදන කමිටුව
නිවාස හා ප්‍රජාසංවර්ධන කමිටුව
සෞඛ්‍ය සනීපාරක්ෂාව, අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව
සභාපති
ලේකම්
ප්‍රධාන කළමනාකරණ සහකාර
ප්‍රජා සෞඛ්‍ය සේවා අංශය
ආදායම් හා ගිණුම් අංශය
ආයතන අංශය
සැලසුම් හා සංවර්ධන අංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී
ආදායම් පරිපාලක
වෙළෙඳපොල භාරකරු
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී
කාර්යාල කාර්ය සහායක
කාර්යාල මුරකරු
සංවර්ධන නිලධාරී
රියදුරු
කළමනාකරණ සහකාර නිලධාරී
විදුලි කම්කරු
කාර්මික නිලධාරී
ට්‍රැක්ටර් රියදුරු
මාර්ග කම්කරු අධීක්ෂක
මාර්ග කම්කරු
සෞඛ්‍ය කම්කරු අධීක්ෂක
සෞඛ්‍ය කම්කරු
ආයුර්වේද වෛද්‍ය නිලධාරී
ඖෂධ සංයෝජක
ආයුර්වේද සහායක
කම්කරු
මුරකරු
පුස්තකාලාධිපති
පුස්තකාල සහායක
කාර්යාල කාර්ය සහායක

අප ආයතනයේ මෙහෙවරට ළඟාවීම සඳහා සභාපතිතුමා ඇතුළු මහ සභාව හා සභාව විසින් පිටුවාගෙන ඇති විවිධ කමිටුවලින් ගන්නා වූ තීරණ, වඩාත් කාර්යක්ෂම හා සපලදායීව ක්‍රියාවට නැංවීම සඳහා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ගන්නා වූ වෑයම අතිමහත්ය.

## ක්‍රියාත්මක තත්ත්වයේ පවතින කමිටු

### සැලසුම් කමිටුව

**අරමුණ**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා නිවාස සහ නගර නිර්මාණ ආඥා පනතේ නීති රීති වලට අනුකූලව ද ,නාගරික බල ප්‍රදේශයට අයත් ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරී පනතේ නීති රීති වලට අනුකූලව ද,ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට යටත්ව හා මාර්ග සංවර්ධන අධිකාරියේ නීති රීති රෙගුලාසි වලට යටත්ව සහ අනෙකුත් රාජ්‍ය ආයතන වල නීති රීති වලට අනුකූලව සිදු කරන සියළුම ඉදි කිරීම් සඳහා අනුමැතිය ලබා දීම මෙම කමිටුව විසින් සිදු කරයි.

| සාමාජිකයින් සංඛ්‍යාව | කමිටු වාර ගණන |
|---|---|
| 06 | 09 |

### විගණන හා කළමනාකරණ කමිටුව

**අරමුණ**

පළාත් පාලන ආයතන නිරන්තරයෙන්ම විගණන විමසුම්වලට යොමු වන බැවින් ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ අරමුණ වේ. විගණකාධිපතිගේ හා අභ්‍යන්තර විගණනයේ උපදෙස් හා මගපෙන්වීම, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශණ හා ප්‍රජා සංවර්ධන නිලධාරීගේ ද සහභාගීත්වයෙන් අප ආයතනයේ වියදම් පාලනය කරමින් ආදායම් ක්‍රමවත්ව පවත්වා ගනිමින් මෙම කමිටුව වසරේ කාර්තු 04 ක් තුළ පවත්වාගෙන යාමයි.

| සාමාජිකයින් සංඛ්‍යාව | කමිටු වාර ගණන |
|---|---|
| 07 | 04 |

## ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහයවීමේ කමිටුව

අරමුණ

ප්‍රාදේශීය සභාවේ කාර්යය කර්තව්‍ය ඉටු කිරීම හා සභා අරමුදල් වැය දැරීම අනුමත කිරීමට පූර්වයෙන් ලේකම්වරයා ඒ පිළිබඳ නිර්දේශ ලබා ගැනීම. 07 කි.

| සාමාජිකයින් සංඛ්‍යාව | කමිටු වාර ගණන |
|---|---|
| 07 | 38 |

## ප්‍රසම්පාදන කමිටුව

**අරමුණ**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු අඛන්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා අනුමත පිරිවිතරවලට අනුව වඩා ලාභදායි ආකාරයට මිලදී ගැනීමට අවශ්‍ය හොදම ගැණුම්කරු තෝරා ගැනීම සම්බන්ධ තීරණ ගැනීම සදහා පිහිටුවා ඇති ප්‍රසම්පාදන කමිටුව සාමාජිකයින් 5 කින් සමන්විත වේ.

2023 වර්ෂයේ පැවැත් වූ මුළු කමිටු සංඛ්‍යාව = 17

අපආයතනයේ මෙහෙවරට ළගාවීම සදහා සභාපතිතුමා ඇතුළු මහ සභාවේ දායකත්වයෙන් පිහිටුවා තිබූ පහත සදහන් කමිටු 2023 මාර්තු මස මහ සභාව විසුරුවා හැරීමෙන් අනතුරුව තාවකාලිකව ක්‍රියාත්මක කිරීම අත් හිටුවා ඇත.

1. **මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව**
2. **නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**
3. **සෞඛ්‍ය, සනීපාරක්ෂාව, ඝන අපද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය වෙළදපල පිළිබද උපදේශක කාරක සභාව**
4. **කාර්මික සේවා කමිටුව**
5. **විදුලිය, ජලය, රථවාහන නැවතුම්, පදික වෙළදාම පිළිබද කමිටුව**
6. **පරිසර හා පහසුකම් කමිටුව**

| | |
|---|---|
| කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව | |
| 01. ඩී.ආර්. රාමචන්ද්‍ර මහතා | 1931 - 1936 දක්වා |
| 02. ඩී. අරනෝලිස් කලටුවාව මහතා | 1936 - 1939 දක්වා |
| 03. එච්.ඒ.පී. කලටුවාව මහතා | 1939 - 1948 දක්වා |
| කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් කාර්ය සභාව | |
| 01. එච්.එන්. නන්සොදා මහතා | 1948 - 1951 දක්වා |
| 02. ජේ.එම්. සමරසිංහ මහතා | 1951 - 1956 දක්වා |
| 03. ජී.එච්. පොඩියා මහතා | 1957 - 1960 දක්වා |
| 04. ඩී. සමරක්කොඩි මහතා | 1957 - 1960 දක්වා |
| 05. එච්.ඩබ්.එච්.ආර්.ජී. මාරඹ බණ්ඩාර මහතා | 1964 - 1977 දක්වා |
| විශේෂ කොමසාරිස් පාලනය 1977 - 1991.06.31 දක්වා | |
| ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | |
| 01. එස්.ඩී. ෂෙල්ටන් සමරසේකර මහතා | 1991.07.01 - 0997.04.14 දක්වා |
| 02. ජී.එම්. කරුණාපාල මහතා | 1997.04.15 - 1999.03.27 දක්වා |
| 03. ඩබ්.එස්. වීරසිංහ මහතා (වැ.බ.සභාපති) | 1999.03.28 - 1999.05.31 දක්වා |
| 04. ඒ.ඩී. සරත් සන්දනායක මහතා | 1999.06.14 - 2001.04.23 දක්වා |
| 05. කේ.එල්. රත්නායක මහතා | 2002.04.24 - 2004.07.23 දක්වා |
| 06. යුවරාජ් සදේව චන්ද්‍රසේකර මහතා | 2004.07.24 - 2006.04.14 දක්වා |
| 07. ඒ.ඩී. සරත් සන්දනායක මහතා | 2006.04.15 - 2015.05.15 දක්වා |
| විශේෂ කොමසාරිස් පාලනය 2015.05.16 - 2018.03.19 දක්වා | |
| ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | |
| 01. එම්.පී. තිලක් රෝහණ ජයවික්‍රම මහතා | 2018.03.20 - 2022.05.16 දක්වා |
| 02. රුවන් ලියනගේ (වැ.බ.සභාපති) | 2022.05.17 - 2023.03.19 දක්වා |

සභාපති කාමරය



**04. ආයතනික කාර්ය සාධනය**

01. පොදු පරිපාලනය
02. සෞඛ්‍ය සේවා
03. භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි
04. ජල සේවා
05. මහජන උපයෝගී සේවා
06. සුභ සාධන සේවා



බසාර් ජුම්මා මුස්ලිම් පල්ලිය

## පොදු පරිපාලනය

ආයතනයේ කාර්ය මණ්ඩලයේ ඇති ශක්තීන්, කුසලතාවයන්, දැනුම අත්දැකීම් ආයතනයේ ඇති වටිනාම සම්පත වේ.

මනා දක්ෂතාවයෙන් හා කුසලතාවලින් පිරිපුන් සේවක පිරිසක් නොමැති නම් ආයතනයට තම අරමුණු හා පරමාර්ථ කරා යාමට අපහසු වේ.

එම නිසා ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ මානව සම්පත විධිමත් ලෙස යොදවා ගැනීම උදෙසා ආයතනය සඳහා වූ මානව සංවර්ධන සැලැස්මක් පහත පරිදි සකස් කර ඇත.එම සැලැස්ම ආයතනයේ කෙටි කාලීන හා දිගු කාලීන අවශ්‍යතාවයන් ඉලක්ක කරගෙන සකසා ඇති අතර විශේෂයෙන් පුද්ගල සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබා දී ඇත.

**01. පුහුණු වැඩසටහන්**

1. **විෂයානුබද්ධ පුහුණු**
2. **කුසලතා වර්ධන පුහුණු**
3. **භාෂා හැකියාවන් වර්ධන පුහුණු**
4. **තොරතුරු තාක්ෂණික පුහුණු**

**02. විෂයයන් කලින් කලට මාරු කිරීම.**

**03. රාජකාරි ආවරණය තුලින් දැනුම ලබා දීම.**

**04. කාර්ය මන්ඩල රැස්වීම් වල දී අදහස් හුවමාරු කර ගැනීම.**

**05. පුහුණුවීම් තුලින් ලබා ගන්නා දැනුම හා අත්දැකීම් වාර්තා කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන යාම.**

**06. ඒ ඒ විෂයයන් සඳහා කාර්ය පටිපාටි සහිත ගොණුවක් පවත්වාගෙන යාම.**

**07. කම්කරුවන් අතර රාජකාරි මාරු කිරීම.**

## 2023 මානව සංවර්ධන සැලැස්ම

| අපේක්ෂිත නිපුණතා මට්ටම | පවතින නිපුණතා මට්ටම | අවශ්‍ය පුහුණුව | සැලසුම් කළ පුහුණු වැඩසටහන් |
|---|---|---|---|
| ආයතනයේ "දැක්ම" ළඟා කරගැනීම සඳහා අවශ්‍ය වන නවීන තාක්ෂණික දැනුමින් සමන්විත කුසලතාවයෙන් හා ආකල්පවලින් පිරිපුන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් | මෙම ආයතනයේ සැලකිය යුතු නවක නිලධාරීන් ප්‍රමාණයක් වන බැවින් මූලික දැනුමක් ලබා දිය යුතු මට්ටමේ පවතී. | ආයතනික හා පරිපාලන කාර්යයන් සම්බන්ධ පුහුණු වැඩසටහන් | ආයතන සංග්‍රහය |
| | | | ලිපිගොනුකරණය |
| | | | වැටුප් සකස් කිරීම |
| | | | නිවාඩු විෂය භාර නිලධාරියාගේ කාර්යභාරය |
| | | | කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව |
| | | | පෞද්ගලික ලිපිගොනු නඩත්තුව |
| | | | ලේඛනාගාර සංරක්ෂණය |
| | | | පලාත් පාලන නීතිය |
| | | | ඉංග්‍රීසි භාෂාව හා දෙමල භාෂාව පිළිබඳ පුහුණුව |
| | | | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති සමාලෝචනය පිළිබඳ පුහුණුව |
| | | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි හා අනෙකුත් ගිණුම්කරණ කටයුතු හා සම්බන්ධ පුහුණු | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි |
| | | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය |
| | | | විගණන කටයුතු පිළිබඳව පුහුණුව |
| | | | ගිණුම් කටයුතු පිළිබඳව පුහුණුව |
| | | | නව විශ්‍රාම වැටුප් නීති පිළිබඳව දැනුවත් කිරීම |
| | | | අයවැය සකස්කිරීම |
| | | | බදු පිළිබඳ (වරිපනම්) |

| | | | |
|---|---|---|---|
| | | ධනාත්මක චින්තනය, නායකත්ව පුහුණුව, ආකල්ප වර්ධනය ආදී පෞරුෂත්ව වර්ධන පුහුණු | ධනාත්මක චින්තනය |
| | | | රසවින්දනය තුලින් මානව ශක්තීන් වර්ධනය |
| | | | ආයතනික කනිෂ්ඨ සේවකයින් සඳහා අදාල රාජකාරි, ආගන්තුක සත්කාර සහ ආචාර විධි පිලිබඳ වැඩමුළුව |
| | | | පෞරුෂ සංවර්ධනය |
| | | | ආකල්ප වර්ධන වැඩසටහන |
| | | රථ වාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය | වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව |
| | | ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන් | කසල කළමනාකරණය |
| | | | හරිත ඵලදායීතාව |
| | | | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය |
| | | | කොම්පෝස්ට් නිෂ්පාදනය |
| | | | කමර්ාන්ත විෂය සම්බන්ධව |
| | | සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ පුහුණු වැඩසටහන් | ප්‍රාදේශීය සංවර්ධන යෝජනා සකස් කිරීම |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ පුහුණු | වෙබ් අඩවි නිමර්ාණකරණය, පරිගණක මෙහෙයුම් පද්ධති, නවීන මෘදුකාංග, දත්ත විශ්ලේෂණ මෘදුකාංග |
| | | ආයුර් වේදය සම්බන්ධ පුහුණු වැඩසටහන් | පංච කමර්, කැඩුම් බිඳුම් |
| | | පුස්තකාල සම්බන්ධ පුහුණු වැඩසටහන් | පුස්තකාල කලමනාකරණය, මාගර්ස්ථ පුස්තකාල වැඩසටහන |

# 2023 කාර්යමණ්ඩල පුහුණු

| පුහුණු වැඩමුළුව | සහභාගිත්වය | පුහුණුව ලබා දුන් මාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| අවසන් ගිණුම් සකස් කිරීම -දින 2 | 2 | √ | | | | | | | | | | | |
| ප්‍රසම්පාදනය - දින 2 | 2 | √ | | | | | | | | | | | |
| තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී පරිපාලන නීතිය යොදා ගැනීම- දින2 | 1 | √ | | | | | | | | | | | |
| MS Power point - දින 2 | 2 | √ | √ | | | | √ | | | | | | |
| ගොඩනැගිලි සැලසුම් අනුමත කිරිම සම්බන්ධයෙන් ඇති ගැටළු- දින 1 | 2 | | √ | | | | | | | | | | |
| ආයතන සංග්‍රහය - දින2 | 1 | | √ | | | | | | | | | | |
| MS Excel -දින 2 | 1 | | | √ | | | | | | | | | |
| සංවර්ධන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව -දින 3 | 7 | | | √ | √ | | √ | | | | | | |
| ආයතනික සැලසුම්කරණය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක යොදා ගැනීම -දින 2 | 2 | | | √ | | | | | | | | | |
| රසවින්දනය තුලින් මානව ශක්තීන් වර්ධනය -දින | 1 | | | √ | | | | | | | | | |
| CAT 2020 ( ආදායම් සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබා දීමේ) මෘදුකාංගය පිලිබඳ දැනුවත් කිරිම - දින 1 | 4 | √ | | | | | | | | | | | |
| දෙමළ භාෂා පැය 150 පුහුණුව | 3 | √ | | | | | | | √ | √ | √ | √ | |
| GIS තාක්ෂණය භාවිතා කර මාගර් සිතියම්ගත කිරීම - දින 1 | 5 | | √ | √ | | | | | | | | | |
| Computer Hardwear -දින 1 | 1 | | | | | √ | | | | | | | |
| පුස්තකාල කළමනාකරණය - දින1 | 4 | | | | | √ | | | | | | | |
| ආපදා කලමනාකරණය- දින2 | 2 | | | | | √ | | | | | | | |
| මූලික පරිගණක පුහුණුව -දින 3 | 5 | | | | | √ | √ | | √ | √ | | | |
| සබරගමු පළාත් දත්ත පද්දතිය සකස් කිරීම - දින1 | 2 | | | | | √ | | | | | | | |
| පුද්ගලික ලිපි ගොනු නඩත්තුව - දින 2 | 1 | | | | | √ | | | | | | | |
| වත්කම් කළමනාකරණය - දින 2 | 2 | | | | | | √ | | | | | | |
| නීති කටයුතු - දින3 | 4 | | | | | | √ | √ | | | | | |
| තොරතුරු පනත - දින 1 | 5 | | | | | | √ | | | | | | √ |
| පලාත් පාලන ආයතන කටයුතු නියාමනය සහ ඇගයීම - දින1 | 3 | | | | | | √ | | | | | | |
| මූල්‍ය කළමනාකරණය - දින 1 | 5 | | | | | | √ | | | | | | |
| ලිපි හා වාර්තා ලිවීම (ඉංග්‍රීසි) - දින 2 | 1 | | | | | | √ | | | | | | |
| අවසන් ගිණුම් සහ වාර්ෂික වාර්තා සකස් කිරීම අධ්‍යනය (බලංගොඩ නගර සභාව) -දින 1 | 4 | | | | | | | √ | | | | | |
| Advance MS Excel -දින 2 | 1 | | | | | | √ | | | | | | |
| වැටුප් පරිවර්තන -දින 2 | 1 | | | | | | | √ | | | | | |
| ගබඩා කළමනාකරණය හා භාන්ඩ සමීක්ෂණය - දින 2 | 2 | | | | | | | | √ | | | | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සූයර් බලශක්ති පද්දති ස්ථාපනය - දින 1 | 1 | | | | | | | | √ | | | | |
| සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි -දින 1 | 1 | | | | | | | | √ | | | | |
| පලාත් පාලන ආයතනවල කායර් භාරය සහ ධනාත්මක මහජන සබඳතා පවත්වාගෙන යාම - දින2 | 1 | | | | | | | | √ | | | | |
| කායර්ාල ක්රම සහ ලිපි ගොනු කළමනාකරණය - දින 3 | 2 | | | | | | | | √ | √ | | | |
| දෙමළ භාෂා පැය 100 පුහුණුව | 4 | | | | | | | | √ | √ | √ | √ | √ |
| රාජ්ය ආයතන සඳහා ප්රථමාධාර - දින 1 | 4 | | | | | | | | | √ | | | |
| පුස්තකාල සඳහා පොත් බැඳුම්කරණය - දින 1 | 4 | | | | | | | | | √ | | | |
| පළාත් පාලන ආයතනවල ණය ශේෂ නිරවුල් කිරීම - දින 1 | 3 | | | | | | | | | √ | | | |
| කායර් සාධණ වධර්නය සහ ශක්තිමත් කිරිමේ මෙවලම - දින 1 | 2 | | | | | | | | | √ | | | |
| රාජ්ය භාෂා ප්රතිපත්තිය ඵලදායීව ක්රියාත්මක කිරීම - දින 2 | 4 | | | | | | | | | √ | | | |
| පළාත් පලාන විගනනය -දින 1 | 1 | | | | | | | | | √ | | | |
| පළාත් පාලන ආයතනවල ආදායම් සැලැස්ම සැකසිම - දින 1- දින 1 | 3 | | | | | | | | | √ | | | |
| රාජ්ය ගිණුම්කාරක සභා | 2 | | | | | | | | | √ | | | |
| පළාත් පාලන ආයතනවල ඉඩම් ගැටළු නිරාකරණය -දින 01 | 2 | | | | | | | | | √ | | | |
| Non Financial Management System (NFAMS) -දින 01 | 2 | | | | | | | | | √ | | | |
| නීතිය පිළිබඳ ස.ප.ස.නිලධාරීන් දැනුවත් කිරිම - දින 1 | 1 | | | | | | | | | √ | | | |
| ලිපි හා වාතර්ා සැකසීම (සිංහල) - දින 2 | 2 | | | | | | | | | | √ | | |
| කණිෂ්ඨ සේවක සේවාරමභක පුහුනුව -දින 4 | 3 | | | | | | | | | | √ | √ | |
| පලාත් පාලන ආයතන සැලසුම්කරණය සඳහා සහ අයවැයකරණය සඳහා තිරසර සංවධර්න අභිමතාථර් යොදා ගැනීම -දින 1 | 2 | | | | | | | | | | √ | | |
| අතුරු ව්යවස්ථා සකස් කිරීම -දින 01 | 1 | | | | | | | | | | √ | | |
| Workshop on online learningPlatforms -දින 1 | 3 | | | | | | | | | | √ | | |
| කොන්ත්රාත් කළමනාකරණය -දින 1 | 1 | | | | | | | | | | | √ | |
| පළාත් මට්ටමින් ආපදා අවදානම් අවම කිරිම දින 1 | 2 | | | | | | | | | | | √ | |

එසේ ලබාදුන් පුහුණු කිහිපයක්

- **ගිණුම් පිළිබඳ පුහුණුව**
- **බයෝ ගෑස් නිපදවීම**




- **සේවක දිරිගැන්වීමේ වැඩසටහන්**

2023 වර්ෂයේ සෞඛ්‍ය හා මාර්ග කම්කරු මහත්ම මහත්මීන් මූලික කර ගනිමින් සේවක අභිප්‍රේරණය හා ඔවුන් ඇගයීම වෙනුවෙන් ත්‍යාග බෙදාදීමේ උත්සවයක් සබරගමුව පළාත් වැඩසටහන් පාලන කොමසාරිස්තුමන්ගේ ප්‍රධානත්වයෙන් ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. එහි අවස්ථාවන් කිහිපයක් පහත ඡායා රූපයෙන් දැක්වේ.

ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව මෙන්ම පිරිසිදු ගරයක් නිර්මාණය කිරීම උදෙසා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් අතීතයේ සිටම ක්‍රියාත්මක කරනු ලබන වැසටහන් අනාගතයට ගැළපෙන පරිදි යාවත්කාලීන වෙමින් ඉදිරියටම ගමන් කරමින් පවතී.




## ප්‍රජාව උදෙසා අපගේ සේවාවන්

- ව්‍යවසායකයින් සවි බල ගැන්වීමේ අරමුණින් බිම්මල් නිශ්පාදන වැඩසටහන




- පාසල් ළමුන් සඳහා ආකල්ප සංවර්ධන හා මනෝ චිකිත්සත වැඩසටහන




- පෙර පාසල් දරුවන් සඳහා ආත්මාරක්ෂක වැඩසටහන




- ව්‍යවසායකයින් සවි බල ගැන්වීමේ අරමුණින් ඉදල් නිශ්පාදනය කිරීමේ වැඩසටහන





- කුඩා පරිමාන වගා කරුවන් සඳහා කොම්පෝස්ට් පොහොර බෙදා දීමේ වැඩසටහන





- ව්‍යවසායකයින් සවි බල ගැන්වීමේ අරමුණින් බෑග් නිශ්පාදන වැඩසටහන





## සෞඛ්‍ය සේවා

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීම සඳහා රෝග හා ශරීරික සෞඛ්‍ය කෙරෙහි සමාජයෙන් ඇති කරන බලපෑම් කෙරෙහි අවධානව යොමු කරමින් ජනතාවට විශිෂ්ට හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපැයීම ප්‍රමුඛ අරමුණ වේ.

ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව මෙන්ම පිරිසිදු ගරයක් නිර්මාණය කිරීම උදෙසා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් අතීතයේ සිටම ක්‍රියාත්මක කරනු ලබන වැසටහන් අනාගතයට ගැළපෙන පරිදි යාවත්කාලීන වෙමින් ඉදිරියටම ගමන් කරමින් පවතී.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව මෙන්ම පිරිසිදු ගරයක් නිර්මාණය කිරීම උදෙසා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් අතීතයේ සිටම ක්‍රියාත්මක කරනු ලබන වැසටහන් අනාගතයට ගැළපෙන පරිදි යාවත්කාලීන වෙමින් ඉදිරියටම ගමන් කරමින් පවතී.

**ප්‍රජාව උදෙසා අපගේ සේවාවන් -**

- කසල කළමනාකරණ වැඩසටහන්
- රෝග වාහක පාලන සේවා
- පාරිසරික බලපත්‍ර ලබාදීමේ සේවා
- ආහාර සුරක්ෂිත හා පරීක්ෂණ සේවා
- මළ අප ද්‍රව්‍ය කළමනාකරණ සේවා
- රුක්රෝපණ වැඩසටහන්
- ආයුර්වේද හා සුවකම් සේවා
- මාතෘ හා ළමා ආරක්ෂණ සේවා

○ **කසල කළමනාකරණය**





කසල කළමනාකරණයේදී මූලික පියවර විය යුත්තේ කසල සම්බන්ධයෙන් ජනතාව තුළ පවතින විවිධ චර්යාවන් සහ ඇබ්බැහිකම් වෙනස් කිරීමට කටයුතු කිරීමයි. කසල ජනනය හැකි අයුරින් අවම කිරීම, කසලවලින් නැවත භාවිතා කළ හැකි දේ වෙන් කොට නැවත යොදා ගැනීමට පෙළඹවීම, ප්‍රතිචක්‍රීකරණය, කසල නිතිපතා බැහැර කරවීමට පෙළඹවීම. ආදිය එවැනි සැලැස්මක ඇතුළත් කළ යුතු මූලික කරුණු අතර වේ.

ඒ අනුව විධිමත් පරිදි කසල කළමනාකරණය සිදු  කිරීම උදෙසා පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය  සභාව කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියා මාර්ග රැසක් ගෙන තිබේ. එම ක්‍රියා මාර්ගයේ සාර්ථකත්වය හේතුවෙන් පිරිසිදු නගරයක් නිර්මාණය කිරීමට  කසල කළමණාකරණ ව්‍යාපෘතියක් වශයෙන් සාර්ථකත්වයක් හිමි කර ගැනීමට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට හැකි වී තිබේ.

පරිසර හිතකාමී ආනන්දනීය නගරයක් නිර්මාණය කිරීමෙහිලා නගරවැසියන්ගේ අනාගත පුනර්ජීවනය යහපත් කර ගැනීමේ අරමුණ ඇතිව නව අදහස් එකතු කරමින් නිර්මාණශීලී ක්‍රයාමාර්ග රැසක් වර්තමානයේදී ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභාවක් බවට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව පත්වෙමින් තිබේ.

**කසල කළමනාකරණ සැලැස්ම**




**කසල එකතු කිරීමේ වැඩසටහන්**

කසල නිවෙස් වලින් එක්රැස් කිරීමේ සිට එම කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ ක්‍රියාවලිය දක්වා වූ කාරණා රැසක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශය මඟින් සිදු කරන අතර, මෙය රජයට ආර්ථික වශයෙන් බරක් නොවන ආකාරයට ක්‍රියාත්මක කිරීමට විශේෂයෙන් කටයුතු කර තිබේ.

ඒ අනුව කසල එකතු කිරීමේ ක්‍රියාවලියද නගරය තුළ විධිමත් පරිදි සිදු කරන අතර, කසල වර්ගකළයුතු ආකාරය, කසල බැහැර කිරීම මෙන්ම නොදිරන කසල හා දිරන කසල වශයෙන් කසල වෙන් වෙන්ව එකතු කරනු ලබන දින සහ කාල වකවානු ගැන සඳහන් කාල සටහන් සකස් කර සියලු වැසියන් දැනුවත් කිරීම වර්ෂය මුලදී සිදු

.

- කසල  කළමනාකරණ වැඩසටහන්







## කසල බැහැර කිරීම





ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශයේ කසල එකතු කිරීම කලාප 4කට බෙදා සිදු කරන අතර, සකස් කරන ලද කාල සටහනක් අනුව දිනපතා දිරන කසල එකතු කරනු ලබයි. ඒ සඳහා ට්‍රැක්ටර් 4ක් යොදවා ඇත.

මෙසේ එකතු කරන කසල අවසාන වශයෙන් බේරුවාන ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කසල අංගනයට බැහැර කරනු ලබයි. එහිදී දිරන කසල කාබනික පොහොර නිෂ්පාදනයට යොමු කරන අතර තව දුරටත් කසල වෙන් කිරීමට අවශ්‍ය වූ විට එයද සිදු කරනු ලබයි.

## කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය

වාණිජ්‍ය වටිනාකමක් ඇති ප්‍රධාන කාබනික පොහොර වර්ගයක් ලෙස කොම්පෝස්ට් හැඳින්විය හැක. කොම්පෝස්ට් නිෂ්පාදනය පරිසරයට, සමාජයට හා කෘෂි කර්මාන්තයට ප්‍රයෝජන අවස්ථා සලසන ක්‍රියාවලියකි. අප ද්‍රව්‍ය ක්‍රමවත්ව කළමනාකරණය කරන ක්‍රමවේදයක් ලෙස කොම්පෝස්ට් නිෂ්පාදනය පෙන්වා දිය හැකි වේ.

ඒ අනුව බේරුවාන ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට රැගෙන එන කසල අතරින් දිරන කසල උපයෝගී කරගෙන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබයි. නිපදවනු ලබන කොම්පෝස්ට් පොහොර ප්‍රාදේශීය සභා කාර්යාලයේදීම අලෙවි කරනු ලබයි. 2023 වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර කිලෝ 19430 ක් නිෂ්පාදනය කර ඇත. එමෙන්ම එම පොහොරවලින් කිලෝ 3434 ක් 2023 වර්ෂයේදී අලෙවි කර ඇති අතර එම අලෙවියෙන් රුපියල් 109,690.00 ආදායමක් ලබා ඇත.



## .පොලිතීන් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය



පොලිතීන් හා ප්ලාස්ටික් බාහිර පරිසරයේ පිලිස්සීම අහිතකරය. ප්ලාස්ටික් බාහිර පරිසරයේදී පිලිස්සීමේ දී නිපදවෙන විෂ වායුන් මිනිස් සිරුරට, ශ්වසනයට බාධා ඇති කරයි. එබැවින් එවැනි කැලි කසල සඳහා ලබා දිය හැකි හොඳම විසඳුම වනුයේ ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමයි. පොළිතීන්, ප්ලාස්ටික්, වීදුරු ආදිය නැවත ප්‍රයෝජනයට ගත හැකි වටිනාකමක් ඇති සම්පතක් බැවින් නැවත මුදල් බවට හැරවීමට හෝ ඒවා ප්‍රතිචක්‍රීකරණය මඟින් නැවත ප්‍රයෝජනයට ගත හැක.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ද මේ වන විට බෙල් යන්ත්‍රයක් යොදා ගනිමින් ප්ලාස්ටික් හා පොළිතීන් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතී. එමඟින් ආර්ථික ලාභයක් මෙන්ම පොළිතීන් ප්ලාස්ටික් පරිසර හිතකාමී ලෙස යොදා ගැනීමට හැකියාව ලැබේ.

ප්ලාස්ටික් බෝතල් හා අවශේෂ භාණ්ඩ එකතු කිරීම සඳහා ප්‍රධාන මාර්ග අසල බහාලුම් ස්ථානගත කර ඇත.



- ○ **රෝග වාහක පාලන සේවා**

## ඩෙංගු මර්ධන වැඩසටහන්



ඩෙංගු වසංගතය මේ වන විට ජාතික වසංගතයක් දක්වා වර්ධනය වී ඇත. මේ හේතුව නිසා මේ වන විට ඩෙංගු මර්ධන කිරීමට පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සෘජු දායකත්වයක් ලබා දේ. ඒ අනුව ඩෙංගු උවදුර මර්ධනය කිරීම සඳහා ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය වර්ධනය කිරීම සඳහා නිරන්ත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම කටයුතු කරයි.

ඩෙංගු මර්ධන සඳහා ග්‍රාමීය මට්ටමේ දැනුවත් කිරීම් සිදු කරන අතර පිරිසිදු කිරීම් කටයුතුවලදී බැහැර වන පොළිතීන්, ප්ලාස්ටික් බෝතල්, වීදුරු බෝතල්, පොල් කටු හා යෝගට් කෝප්ප වැනි දේ දිනයක් ලබා දී ට්‍රැක්ටර් මඟින් එකතු කිරීම සිදු කරයි. දෛනික කසල එකතු කිරීම සිදුවන්නේ නාගරික ප්‍රදේශවල පමණක් වුවද ඩෙංගු මර්ධන වැඩ සටහන් යටතේ ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාවට නොදිරන කසල ක්‍රමවත්ව බැහැර කිරීමට අවස්ථාවක් හිමි වන අතර ඩෙංගු බෝවන ස්ථාන විනාශ කිරීමට එමඟින් මහඟු පිටිවහලක් ලැබී ඇත.

ඩෙංගු මර්ධනය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා එක්ව ශ්‍රමදාන කටයුතු සිදු කරනු ලබයි. ඩෙංගු මර්ධනය සඳහා ජනතාව තුළ යහපත් පුරුදු වර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමේ සිට දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර එමඟින් ක්‍රමවත්ව කසල බැහැර කිරීමට දරුවන් පුරුදු කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

- බිසෝදොළ ඇල්ල ආශ්‍රිතව කරන ඩෙංගු මර්ධන වැඩසටහන






- රෝග වාහක පාලන සේවා



### ○ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම

පරිසර කටයුතු විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළාත් පාලන ආයතනවලට බලය පවරන ලද කාර්යයන් අතරින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ප්‍රමුඛ ස්ථානයක් ගනී. පළාත් පාලන ආයතනවලට බලය පවරන කර්මාන්ත කලින් කලට වෙනස් කරනු ලබන අතර වර්තමානයේ කර්මාන්ත 39 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි. එලෙස නිකුත් කරනු ලබන බලපත්‍රයක් වර්ෂ 3ක් සඳහා වලංගු වන අතර වලංගු කාලය අවසන් වීමට මාස 3කට පෙර බලපත්‍රය අලුත් කළ යුතු වේ.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිර්දේශ යටතේ බලපත්‍ර නිකුත් කිරීම සිදු කෙරෙන අතර අවශ්‍ය වන උපදෙස් ලබාදීම සිදු කරයි. පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ තාක්ෂණික කමිටු නිර්දේශය නොමැතිව කිසිදු ආයතනයකට පරිසර බලපත්‍රයක් නිකුත් නොකෙරේ. එමගින් පරිසර හිතකාමී ලෙස කාර්මාන්ත පවත්වාගෙන යාමට ජනතාව උනන්දු කිරීම හා නියාමනය කිරීම අපේක්ෂා කෙරේ



- ආහාර සුරක්ෂිත හා පරීක්ෂණ සේවා

ප්‍රාදේශීය වෙළෙඳ සැල්වල අලෙවි කරනු ලබන ආහාරවල සෞඛ්‍ය ආරක්ෂිත තත්වය පරික්ෂා කිරීම පිණිස ආපනශාලාවල හා හෝටල්වල ආහාර සාම්පල පරික්ෂාව, සනීපාරක්ෂණ තත්වයන් පිළිබඳ නිරන්තර වැටලීම සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හා ඒකාබද්ධව සිදු කරනු ලබයි. එහිදී සෞඛ්‍ය ආරක්ෂිත නොවන ආහාර අලෙවි ආයතනවලට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි. එමගින් සෞඛ්‍යාරක්ෂිත ලෙස ආහාර ලබා ගැනීමට ජනතාවට හැකියාව ලැබී තිබේ.

- ආහාරසුරක්ෂිත හා පරීක්ෂණ සේවා



- මළ අපද්‍රව්‍ය හා සුවකම් සේවා කළමනාකරණය

මළ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ප්‍රාදේශීය සභාවක් සතු වගකීමක් ලෙස පෙන්වා දිය හැකි වේ. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතුව ගලි බවුසර් දෙකක් ඇති නමුත් මළ අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැත. මේ වන විට ඒ සඳහා අවශ්‍ය භූමිය අත්පත් කර ගැනීමේ කටයුතු සාර්ථකව සිදු කරමින් පවතී. ඉදිරියේදී එම සේවාව ජනතා අයිතියට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

නමුත් දැනට අප ආයතන ඉදිරිපිට දැන්වීම් පුවරුවක් මගින් එම සේවාව ලබා ගත හැකි ආයතන පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සිදු කරනු ලැබේ.

- මළ අප ද්‍රව්‍ය කළමනාකරණ සේවා




- **රුක්රෝපණ වැඩසටහන්**

2023 වර්ෂයේ ඇහැළියගොඩ වත්ත හා බිසෝ දොළ ආශ්‍රිතව රුක්රෝපණ වැඩසටහන





- **ආයුර්වේද සුව හා සුවකම් සේවා**

ආයුර්වේද දේශීය වෛද්‍ය වෛද්‍ය ප්‍රතිකාර කටයුතු වෙනුවෙන් ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාව සතු ආයුර්වේද 03 කි.

- දිවුරුම්පිටිය



- දම්මුල්ල



- කීනගහවිල

ග්‍රාමීය හා නාගරික පරිසරයේ ජීවත්වන සෑම වැසියෙකුටම මෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත මහජනතාවගේ රෝගී අවශ්‍යතා සඳහා ප්‍රතිකාර ලබාගැනීමට හැකියාව ලැබී ඇත.

මෙහි ආයුර්වේද වෛද්‍යවරුන් දෙදෙනෙකු හා සේවකයින් යොදවා ඇත.

2023 වර්ෂයේ දී ආයුර්වේද ආධාර වශයෙන් රු.155259 ක වටිනාකමැති බෙහෙත් තොග අපවෙත ලැබී තිබුණි. එසේම වාර්ෂික ඇස්තමේන්තුව මගින් 2023 වර්ෂය සඳහා රු.600,000.00 මුදලක් ආයුර්වේද ඖෂධ සඳහා වෙන්කර ඇත.

එමගින් ලබාගත්  ඖෂධ තොග ආයුර්වේද සඳහා බෙදාහැර තිබුණි.







- **මාතෘ හා ළමා ආරක්ෂණ සේවා**

උපතේ සිට මරණය දක්වා භාරධූර කාර්යයන් රැසක් කැටිවී සේවා සපයන පලාත් පාලන ආයතනවල තවත් එක් කාර්යයකි මාතෘ හා සුව සේවා ආරක්ෂණ සේවය.

- මාතෘ හා ළමා ආරක්ෂණ සේවා








## භෞතික සැලසුම්, මං මාවත්, ඉඩම් හා ගොඩනැගිලි

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත නිවාස හා සංවර්ධන ආඥා පනත හා නගර හා ග්‍රාම නිර්මාණ පනත යන මූලික පනත් හා නීති-රීති යටතේ බලය පැවරේ.

මේ යටතේ බලය පැවරෙන කාර්යන්

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සතු සියළු ඉඩම් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා නඩත්තු කර පවත්වාගන යාම. මං මාවත්, වීථි පහන්, ආදිය සැළසුම් කිරීම ඉදි කිරීම පුළුල් කිරීම නඩත්තු කිරීම මෙමගින් සිදු කෙරේ.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මගින් ඉටු කරන සංවර්ධන ව්‍යාපෘති සඳහා පහත සඳහන් ආයතන ඔස්සේ ප්‍රතිපාදන වෙන් කර කර ගනු ලැබීය.




මෙම ආයතන මගින් වෙන් කර ගන්නා ලද අරමුදල් ඔස්සේ පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති කොට්ඨාශය පුරා ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ සඳහා ඉදිරිපත් කරන ලද මහජන ඉල්ලීම්, ක්ෂේත්‍රෙය් දී හඳුනාගන්නා ලද අවශ්‍යතා, පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ලද උපදෙස් මත හා ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් වඩාත් ප්‍රමුඛ යොජනා සඳහා ප්‍රමුණතාවය ලබා දීමක් සිදු කරන ලදී.

උක්ත අරමුදල් ඔස්සේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ නොමඳ සහය ලැබිණි.

- මාර්ග සංවර්ධනය කිරීම
- ඇලවේලි සුද්ද කිරීම
- බස් නැවතුම්පල අලුත්වැඩියාව
- සභාවට අයත් අයාතනයන්හි වහල අලුත්වැඩියාව
- ප්‍රජාශාලා අලුත් වැඩියාව
- ආදාහනාගාරය පිහිටි භූමියේ අනු ව්‍යාපෘති
- වීථි ලාම්පු සවිකිරීම
- පොළ භූමිය සංවර්ධන
- සති පොල සංවර්ධනය

- ○ **මාර්ග ව්‍යාපෘති**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ සංවර්ධනය විය යුතු මාර්ග පිළිබඳව මහජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් හා හඳුනාගන්නා ලද ස්ථාන ප්‍රමුඛතාවය අනුව සංවර්ධන කෙරිණි. ඒ අතර

- කොන්ක්‍රීට් කිරීම්
- ඉන්ටර්ලොග් ඇල්ලීම
- පැති කානු සැකසීම

ආදිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති අතර ප්‍රධාන කාර්යන් වේ.

.

රටතුල පැවති දුර්වල ආර්ථික පසුබිම හේතුවෙන් සංවර්ධන කටයුතු කෙරෙහි පසුබෑමක් තිබූ කාලයක 2023 වර්ෂයේදී ද රජයෙන් ලැබුණු උපදෙස් හා නීති අනපනත් ද සමග සංවර්ධන කටයුතු සඳහා සීමාවන් පැණවිනි. නමුත් අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරදීම සඳහා පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව හැකි උපරිම දායකත්වයක් ලබා දෙන ලදී.

| මාගර්යේ ස්භාවය | සංවධර්ත දුර m | වැය කරන ලද මුදල |
|---|---|---|
| 01.ප්‍රාදේශීය සභා මාගර් (කොන්ක්‍රීට් ඇතිරීම) | 82 m | 1122432.00 |
| 02.බස් නැවතුම්පළ අලුත්වැඩියාව | | 498382.37 |
| 03.සති පොල අලුත් වැඩියාව | | 896946.12 |
| 04.බෝක්කු අලුත්වැඩියාව | | 487000.00 |
| 05.ඇලවේලි සුද්ද කිරීම | | 355351.00 |
| 06.ආදාහනාගාරය පිහිටි භූමියේ අනු ව්‍යාපෘති | | 281387.05 |
| 07.ප්‍රජා ශාලා අලුත්වැඩියාව | | 278297.46 |
| 08.පැති බැම් සැකසීම | | 305000.00 |
| 09.සභාවට අයත් ගොඩනැගිලි වල වහල අලුත්වැඩියා | | 382052.23 |
| 10.ප්‍රාදේශීය සභාවට අයත් ආයතන වල අත්‍යවශ්‍ය සංවධර්න කටයුතු | | 223836.17 |






## ජල සේවා



ප්‍රධාන මෙහෙයුමට අදාළව ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු මහජනතාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සදහා පිරිසිදු ජලය සැපයීමෙන් ජනතාවගේ නීරෝගීකම ඇති කිරීම අරමුණ වේ.




- **ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම**
- **සභාව සතු ජල ඇහැළියගොඩ**
- **ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ**
- **ජනතාවගේ ව්‍යාපෘති, ජල මූලාශ්‍ර පොදු නාන ළිං, බොන ළිං, නාන තටාක ජල කරාම,ජල උල්පත්, නල ළිං**
- **පවත්වාගෙන යාම වැඩි දියුණු කිරීම හා අළුතින් ඉදි කිරීම.**

සභාව විසින් පාලනය වන ජල ව්‍යාපෘති දෙකක් පවතී.

1. **ගැටහැත්ත පානීය ජල ව්‍යාපෘතිය**
2. **දිවුරුම්පිටිය නිල් දියවර පානීය ජල ව්‍යාපෘතිය**

මෙයින් නිල්දියවර පානීය ජල ව්‍යාපෘතිය මගින් ජල පාරිභෝගිකයින් 56 දෙනෙකු සදහා ද ගැටහැත්ත පානීය ජල ව්‍යාපෘතිය මගින් ජල පාරිභෝගිකයින් 55 දෙනෙකු ප්‍රතිලාභ ලබා ගනී.

මෙම ව්‍යාපෘතීන්වල නඩත්තු කටයුතු සදහා සේවකයින් යොදවා ඇත.

එසේම ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රජා සත්කාරක සේවා යටතේ පහත සදහන් ජල සැපයීම් සිදුකරනු ලබයි.

- **නියග කාලය තුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනතාවගේ ඉල්ලීම්වලට අනුව ජල දුෂ්කරතාවයන් පවතින ස්ථාන කරා ගොස් නොමිලේ ජලය සැපයීම.**
- **වෙසක් පොසොන් හා ඇසල මාස හා වෙනත් ආගමික උත්සව පවත්වන අවස්ථාවලදී ජනතාවගේ ඉල්ලීම පරිදි නොමිලේ ජලය ලබාදීම දිම සිදු කරනු ලබයි.**
- **සබරගමු මහ සමන් දේවාළය මගින් පවත්වන සමන් දේව ප්‍රතිමාව වඩම්මන පෙරහැර සදහා කහවතුර ඉසීම සදහා ජලය ලබා දීම.**
- **පාසැල් ක්‍රීඩා හා වෙනත් උත්සව සදහා ජනතා ඉල්ලීම්වලට අනුව ජලය සැපයීම.**





## වෙනත් මහජන අර්ථකාරී සේවා

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතාවයන් සඳහා වෙළඳ පොලවල් ඉදිකිරීම, වීදි ආලෝක කිරීම, ආදාහනාගාර ඉදිකිරීම හා ඒවා නඩත්තු කර පවත්වාගෙන යමින් ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය සඳහා අනෙකුත් යටිතල පහසුකම් සැපයීම මෙමගින් සිදුකෙරේ. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වසම් 44 ක් පුරා වර්ග කිලෝමීටර් මීටර් 139 ක වපසරියකින් යුක්තව පිහිටා ඇති බැවින් මහ ජනතාවගේ හිතසුව පිණිස ඇහැලියගොඩ මහජන පොළට අමතරව දම්මුල්ල හා ගැටහැත්ත යන ස්ථානවල මහජන පොළවල් 02 ක් පිහිටුවා ඇත.

එසේම කුලියට දී ඇති කඩ කාමර 61 ක් පවතින අතර එය ඇහැලියගොඩ හා ගැටහැත්ත යන නගරවල ස්ථාන ගතවී ඇත. එසේම ඇහැලියගොඩ, දම්මුල්ල හා ගැටහැත්ත යන නගරවල එළුමස් හා හරස් මස් කඩ ද පිහිටුවා ඇති බැවින් මහජනතාවට වඩාත් පහසුවෙන් තමාගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හේතු වී ඇත.

මෙමගින් ලබා ගන්නා කුලී ආදායම 2021 වර්ෂයේ 9,737,897.00 වූ අතර එය 2022 වර්ෂයේ දී 11,873,165.86 ක් විය.2023 වරෂයේ රු.12,088,896.09 අනුව මිලියන 2.35 කින් 2021 වර්ෂයට වඩා 2023 වර්ෂයේ කුලී ආදායම වැඩි වී ඇති බව පෙන්වා දෙමි.





ඇහැලියගොඩ සතිපොළ


ගැටහැත්ත සතිපොළ


දම්මුල්ල සතිපොළ

**සුසාන භූමි හා ආදාහනාගාර**

**සුසාන භූමි**




අපගේ ප්‍රධාන මෙහෙයුමට අදාලව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මගින් බල ප්‍රදේශයේ මහජනතාවට අත්‍යවශ්‍ය සේවාවක් වන සුසාන භූමි 11 ක් පවත්වාගෙන යනු ලබයි. ඒවාහි නඩත්තු හා අලංකරණ කටයුතු සඳහා අප ආයතනය විසින් සේවකයින් යොදවා ඇත.

**ආදාහනාගාර**



මෘත දේහයන් භූමදානය කිරීමට හෝ ආදාහනය කිරීමට ගෘහ ආශ්‍රිත ඉඩ කඩ නොමැත. එබැවින් දේහයන් ආදාහනය කිරීමට අවශ්‍යතා ඇති ජනතාව වෙනුවෙන් ඇහැලියගොඩ විලේගොඩ සුසාන භූමියේ ආදාහනාගාරයක් ස්ථාපිත කර ඇත.

රු.15,400,000.00 ක සභා අරමුදල් යොදවා ඉදිකරන ලද මෙම ආදාහනාගාරය ජනතා අයිතියට පත් කර ඇත. ඇහැලියගොඩ බල ප්‍රදේශයේ හා බල ප්‍රදේශයෙන් පිටත මහ ජනතාව සඳහා විවෘතව පවතින අතර බල ප්‍රදේශයේ ජනතාව සඳහා සහනදායී මිලකට මෘත දේහයන් ආදාහනය කිරීමට ඉඩ සලස්වා ඇති අතර බල ප්‍රදේශයෙන් පිටත ජනතාව සඳහා ද, දැරියහැකි මුදලකට මෘත දේහයන් ආදාහනය කිරීමට සලස්වා ඇත.

මෙසේ මෘත දේහයන් සඳහා මුදලක් අයකල ද එම මුදල ඉක්මවා සභාව මගින් පිරිවැයක් දරණ බැවින් එය අප විසින් කරනු ලබන ජනතා සේවයකි. අප ආදාහනාගාරය තුල දිනකට මෘත දේහ 03 ක් ආදාහනය කිරීමට ඉඩ කඩ සළසා ඇති අතර ඊට වඩා මෘත දේහයන් අප ආදාහනාගාරයට ලැබෙන අවස්ථාවල දී එය වෙනත් ළගම පිහිටි ආදාහනාගාරයන් වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

2023 වර්ෂයේ ආදාහනාගාරයෙන් ලද ආදායම රු.2,250,000 කි.

**වීථි පහන්**



වාර්ෂික ඇස්තමේන්තුවෙන් වීථි පහන් අළුතින් මිළදී ගැනීමට හා නඩත්තු කිරීමට මුදලක් වෙන් කරනු ලබයි. එකී මුදල් යොදවා සෘජු මහජන ඉල්ලීම්වලට හා සභිකයින්ගේ ඉල්ලීම් වලට අනුව අත්‍යවශ්‍ය ස්ථාන කරා අළුතින් වීදි පහන් මිළදී ගැනීමට හෝ අළුත්වැඩියා කිරීම සිදු කරනු ලබයි.

වීථි පහන් ආලෝකන කටයුතු වරිපනම් බල ප්‍රදේශයෙන් ඔබ්බට ග්‍රාමීය ප්‍රදේශවලද විහිදී ඇත.උතුරින් කොළඹ දිස්ත්‍රික් සීමාව දක්වාත්, බටහිරින් කළුතර දිස්ත්‍රික් සීමාව දක්වාත්, නැගෙනහිරින් කෑගල්ල සීමාව තෙක් ද, දකුණින් කුරුවිට සීමාව තෙක් ද, විශාල පරාසයක් තුළ විහිදී ඇත. මහජන පැමිණිලි ලැබුණ සැනින් හැකි ඉක්මනින් ආලෝක කටයුතු නඩත්තු කටයුතු මහජන ප්‍රසාදය ඇති වන පරිදී අප ආයතනය විසින් සිදු කරනු ලබයි.

බල ප්‍රදේශය තුල වීදි පහන් 1500 ක් මේ වන විට සවිකර ඇත.

**පුස්තකාල හා සුභසාධක සේවා**

ඇහැලියගොඩ බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සුබවිහරණය පහසුකම් ආරක්ෂා කිරීම මෙයින් ගම්‍ය වේ. ජනතාවගේ කායික හා මානසික තෘප්තිමත්භාවය ඇති කරලීම සඳහා වඩාත් ගුණාත්මක සේවාවක් ලබාදීම වෙනුවෙන් සුභ සාධන සේවාවන් සැපයීම අඛණ්ඩව අප විසින් සිදු කරගෙන යනු ලබයි.

**පුස්තකාල සේවා**

දැනුම සොයා යන සමාජයක් තුල මහජන පුස්තකාල මගින් ඉටු කරනු ලබන මෙහෙය අති විශාලය. එහිදී එම සමාජයේ අවශ්‍යතා අනුව මහජන පුස්තකාලය ද අනුවර්තනය වන්නේ නම්, සමාජ දියුණුවට විශාල පිටුවහලක් වේ.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මගින් උගතුන් බිහිකිරීමේ අරමුණින් එවැනි මහජන පුස්තකාල 04 ක් බල ප්‍රදේශය වෙත සේවාවන් ලබාදීමට පවත්වාගෙන යනු ලබයි.

- ඇහැලියගොඩ මහජන පුස්තකාලය
- ගැටහැත්ත මහජන පුස්තකාලය
- පලීගල මහජන පුස්තකාලය
- දම්මුල්ල මහජන පුස්තකාලය

ඇහැලියගොඩ බල ප්‍රදේශය හා ඉන් පිටත ප්‍රදේශවල දරුවන්ට හා වැඩිහිටියන්ට පොත්පත් පහසුවෙන් පරිශීලනය සඳහා මෙම පුස්තකාල පහත පරිදි අංශ වශයෙන් බෙදා පහසුකම් සලසා ඇත.

- බැහැරදෙන අංශය-ග්‍රන්ථ සංරක්ෂණ අංශය
- විමර්ශන අංශය-කියවීම් ශාලාව
- පුවත්පත් හා සගරා අංශය-මැණික් එකතුව
- ළමා අංශය-සබරගමු කෘති එකතුව
- අධ්‍යයන අංශය-විශේෂ කෘති එකතුව
- පුස්තකාල මගින් සිදුකල වැඩසටහන්



**ගැටහැත්ත මහජන පුස්තකාලය**




**දම්මුල්ල මහජන පුස්තකාලය**




**ඇහැලියගොඩ මහජන පුස්තකාලය**



**පලීගල මහජන පුස්තකාලය**

**05. යහපාලනය**


01. යහපාලන සංවිධාන ව්‍යුහය

02. යහපාලන ක්‍රියාකාරකම්

03. ආයතනික සමාජ වගකීම

04. තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අපගේ කැපවීම


දෙහිගහපිටිය ක්‍රිස්තියානි පල්ලිය




## යහපාලනය

### යහපාලන සංවිධාන ව්‍යුහය

අප ආයතනයේ ඉලක්ක ළඟාකර ගැනීම සඳහා සභාපතිතුමා ඇතුළු මහ සභාව හා කමිටු වලින් ගන්නා වූ තීරණ, දූෂණ හා අක්‍රමිකතාවයෙන් තොරව වඩාත් කාර්ක්ෂමව හා සඵලදායීව ක්‍රියාවට නැංවීම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.



**යහපාලන ක්‍රියාකාරකම්**







යහපාලන මූලධර්මවලට අනුව ජනතා මෙහෙවර ඉටු කිරීම සඳහා විනිවිධභාවයෙන් යුක්ත කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් සැපයීමට සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් හැකි වී ඇත.

එය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය පහත පරිදි වේ.

- පවතින නීති රීති හා රෙගුලාසිවලට අනුගත වීම මගින්
- මහජනතාව සමග සම්බන්ධවීමෙන්
- සැලසුම් කිරීමෙන් හා වාර්තාකරණයෙන්
- ආපදා කළමනාකරණය
- විධිමත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කිරීමෙන්

## 01. සහභාගිත්ව සංවර්ධනය

යහපාලන ගුණාංග අතරින් පළමු වැන්න මෙයයි. පාලනය සඳහා ජනතා සහභාගීත්වය වර්ධනය කිරීම මෙහි අදහස වේ.

පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සංවර්ධන හා සේවා වැඩ සැළසුම් කිරීම හා කියාත්මනක කිරීමේ දී ඒ සඳහා ජනතා සහභාගීත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ලබයි. එලෙස ජනතා සහභාගීත්වය වර්ධනය කිරීම නිසා පහසුවෙන් අපේක්ෂිත අරමුනු කරා ගමන් කිරීමට හැකියාව ලැබී තිබේ.

- පොදු මහජන සම්පත් වල ආරක්ෂාව
- අවම පිරිවැයකින් ඉටු කර ගැනීමට හැකි වීම
- නාස්තිය හා දූෂණය අවම කර ගැනීමට

එමගින් අප හිමි කර ගත් ප්‍රතිඵල අතර වේ.

### අයවැය ක්‍රියාවලිය සඳහා ජනතාව සහභාගි කරවා ගැනීම

ඉදිරි වර්ෂය සඳහා අයවැය යෝජනා සකස් කිරීමේ දි අයවැය සඳහා නව අදහස් ඉදිරිපත් කිරීමට බල ප්‍රෙද්ශයේ ජනතාවට කාලයක් ලබා දේ.එමගින් ජනතා අවශ්‍යතා හඳුනාගෙන අය වැය කෙටුම්පතට ඇතුලත් කිරීම මත ජනතාවට හිතදායක අය වැයක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී තිබේ.

### සංවර්ධන සේවා සැළසුම් කිරීමේ දී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම

ප්‍රජා මණ්ඩල ක්‍රියාත්මක කරවීම මගින් පාලනය සඳහා මහජන සහභාගීත්වය ඍජුව ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. එම හේතුව නිසා සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දි ඔවුන්ගෙන් ලැබෙන ශ්‍රම දායකත්වය නිසා අඩු පිරිවැයකින් සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමට හැකිවීම ප්‍රාදේශීය සභාවක් වශයෙන් අප ලැබූ ජයග්‍රහණයකි.

### සභා රැස්වීම් සඳහා මහජන ගැලරි සහභාගීත්වය පුළුල් කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව පාලනය සඳහා ජනතාවගේ සහභාගීත්වය වර්ධනය කිරීමට මහා සභා රැස්වීම පැවැත්වෙන දිනයන්හි මහජන ගැලරිය විවෘත නර ඇති අතර ජන මාධ්‍ය වේදීන්ට සහභාගි වීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කර ඇත.

## 02. සම්මුතියෙන් කටයුතු කිරීම.

සම්මුතියෙන් කටයුතු කිරිම යනු කාර්යන් කිරීමට පෙර පුළුල් ලෙස සාකච්ඡා කර මනා ලෙස සංවිධානය කොට මහජන නියෝජනයෙන් සංවිධාන හා ප්‍රජාව සමඟ සාමූහික එකඟතාවයකින් ක්‍රියාවට නැංවීම වේ.

පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සංවර්ධන හා සේවා වැඩ සැළසුම් කිරීම හා කියාත්මනක කිරීමේ දී ඒ සඳහා ජනතා සම්මුතියෙන් කටයුතු කරනු ලබයි. එලෙස ජනතා සම්මුතියෙන් කටයුතු  කිරීම නිසා පහසුවෙන් අපේක්ෂිත අරමුනු කරා ගමන් කිරීමට ගැකියාව ලැබි තිබේ.

- නිවැරදි හා නිරවුල් තීරණ ගැණීමෙට හැකියාව ලැබීම
- මුදල් කාලය හා ශ්‍රමය ඉතිරි වීම
- විනිවිදභාවය හා ජනතා විශ්වාසය වැඩි දියුණු වීම
- සම්පත් අවභාවිතය අවම වීම
- නව අදහස් හා යෝජනා ක්‍රියාවට නැංවිය හැකි වීම

එමගින් අප ළගා කර ගත් ප්‍රතිඵල අතර වේ.

### මහාසභා රැස්වීම

පක්ෂ විපක්ෂ සියළු මහජන නියෝජිතයින් සමඟ සාකච්චා කොට එකඟතාවයකින් යුතුව තීරණ ගැණීම.එහිදී සියළු දෙනා එකඟ නොවන අවස්ථා තිබේ නම් වැඩි ඡන්දයට ප්‍රමුඛතාව දීම

### කමිටු

දේශපාලන හා පරිපාලන මිශ්‍ර සහභාගීත්වයෙන් යුතු කමිටු ක්‍රමයක් තුළින් තීරණ ගැණීමට කටයුතු කිරීම නිසා  විනිවිදභාවය හා ජනතා විශ්වාසය වැඩි දියුණු වීම

### ප්‍රජා සාකච්ඡා

නිරාකරණයට අපහසු ගැටළු පවතින අවස්ථාවන්හි එම ගැටළුවට අදාල පාර්ෂව ගෙන්වා දෙපාර්ෂවය සමඟ සාකච්ඡා කොට සමතයකට පත් කීරිමට කටයුතු කිරීම.

## 03. විනිවිදභාවය

ආයතනයේ සියළු කටයුතු විවෘත ලෙස ද ලාභ ප්‍රෙයා්ජන අපේක්ෂා වලින් තොරව ද මෙහෙයවීම මෙයින් අදහස් වේ.

මෙහිදී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වශයෙන් කරනු ලබන වැඩ හා සේවා සඳහා මහජනයා වෙත විනිවිදබාවයෙන් යුතුව පහත පරිදී සිදු කරනු ලබයි.

- ආදායම් රැස් කිරීම, මුදල් පරිහරණය,භාණ්ඩ හා දේපල භාවිතය සේවා හා සැපයුම් ඉටු කිරීම,දේපල බදු දීම,සේවකයින් බඳවා ගැණීම පිළිබඳ නීති රීති නිවැරදිව පිළිපැදීම
- ජනතාවට තොරතුරු දැන ගැණීමේ අයිතිය ක්‍රියාවට නැංවිම
- සම අවස්ථා සැළසෙන පෞද්ගලික බැදීම් වලින් තොර කාර්ය පටිපාටි පිළිපැදීම
- කාරක සභා කළමණාකරණ කමිටු හා කාර්ය මණ්ඩල රැස්වීම් සෑම මසකම පැවැත්වීම හා සියළු තීරණ ඒවායේ සාකච්ඡා කිරීම.

## 04. ප්‍රතිචාරාත්මක බව

ආයතනයක් මගින් ඉටු කළ යුතු වන සේවාවන් හා උවමනා එපා කම් පිළිබඳ සංවේදී වීම හා සාධාරණ පිළිගත හැකි කාලයක් තුළ සේවාවන් ඉටු කර දීම ප්‍රතිචාරත්මක බව ලෙස හැදින්විය හැකිය.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව පුරවැසි ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත් කර ඒ අනුව නිශ්චිත කාල සීමාවක් තුළ මහජන සේවා ඉටු කිරීම

- පිළිගැණීමේ නිලධාරිනියක් නම් කොට ඇය හරහා මහජන ඉල්ලීම් ඉටු කිරීමට මඟ පෙන්විම
- මහජන පැමිණිළි පෙට්ටියක් හා පොතක් තබා ඒ හරහා පැමිණෙන දුක් ගැනවිලි කඩිනමින් විසදීමට ක්‍රියා කිරීම.
- නිලධාරීන් නිවාඩු යන කල්හි වැඩ ආවරණය සඳහා වෙනත් නිලධාරියෙක් පෙනී සිටීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම

## 05. කාර්යක්ෂම බව හා කාර්යන්හි අදාල බව

ආයතනයක ඵලදායි බව මහජන තෘප්තිය හා විශ්වාසය දිනා ගැණීම මත රදා පවතී. එය ඉහළ නැංවිය හැක්කේ කාර්යක්ෂම උපාය මාර්ග පිළිපැදීම මගිනි.

- නිශ්චිත කාල වකවානු සහිත සැලැස්මකට අනුව කටයුතු මෙහෙය වීම.
- කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය වන කාර්ය පටිපාටි රීති අඩංගු උපදෙස් හා මාර්ගෝපදේශ පිළියෙල කර ක්‍රියාවට නැංවීම.
- සැබෑ අවමනාවන් හදුනා ගැණීමට ප්‍රජා සහභාගීත්වය උපයෝගි කර ගැනීම.
- විධිමත් ලෙස රාජකාරී හා වගකීම් බෙදා හැරීම, වැඩ අධීක්ෂණ ක්‍රම වර්ධනය ක්‍රියාවට නැංවීම ආදිය මඟින් සමස්ත කළමණාකරණය ශක්තිමත් හා කාර්යක්ෂම වීම.

## 06. සාධාරණ බව සහ අන්තර්ගත බව

සැම සමාජ පන්තියක් අතරම සාධාරණ ලෙස සේවා හා සම්පත් බෙදා හැරීම සේවා සම්පාදනය කිරීම මෙමගින් අදහස් වේ.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ඒ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කරනු ලබයි.

- ප්‍රජා උවමනා එපා කම් ගැටළු දුශ්කරතා හදුනාගත හැකි සම්බන්ධතා ජාලයක් වර්ධනය කිරීම.
- වැඩ සහ සේවා පිළිබඳ සැළසුම් සැම කොටසකටම ප්‍රජා සහභාගීත්වය මත සකස් කීරීම.

## 08. නීති ගරුක බව

ආයතනයක් තුළ අණ පනත් අතුරු ව්‍යවස්ථා නීති හා රට තුළ බල පවත්නා නීති රෙගුලාසි වලට අනුව කාර්යන් ඉටු කිරීම නීතිගරුකභාවය නම් වේ.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ඒ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කරනු ලබයි.

- විගණනය හා විමර්ශනය විසින් පෙන්වා දී ඇති අඩු පාඩු දෝශ දර්ශන වහාම නිවැරදි කරීම හා යළි ඇති නොවන ලෙස අවශ්‍ය පියවර ගැණීම.
- මහජන නියෝජිතයින් හා නිළධාරීන් දැනුවත් නෙරෙන වැඩ සටහන් පැවැත්වීම.
- නියමිත කාලය තුළ ආදායම් වියදම් ගිණුම් වාර්තා සකසා සභා ගත කිරීම.
- අතුරු ව්‍යවස්ථා පිළි ගැණීමට හා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම.
- නීතිය පිළිබඳ පුහුණු වැඩ සටහන් මලින් නිළධාරින් දැනුවත් කීරීම.

# තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අපගේ කැපවීම




01. සියළු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම.

02. කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබා ගැනීම හා තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය.

03. සෑම වයසකම සියලු දෙනාටම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

04. සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

05. ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාව ළඟාකර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

06. සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකිබව හා තිරසාර කළමනාකරණය සහතික කිරීම.

07. දැරිය හැකි විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්ති සඳහා සියලුදෙනා ප්‍රවේශය සහතික කිරීම.

08. ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ හා තිරසාර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය.

09. නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරෝත්තු දෙන තිරසාර තත්ත්වයට පත් කිරීම.

10. පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම.

11. දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාර්ග ගැනීම.

| තිරසර සංවර්ධන අරමුණ | ජයග්‍රහණ/ වැඩසටහන | අභියෝග |
|---|---|---|
| 01 දිළිඳුකම පිටු දැකීම | • **බිම් මල් නිෂ්පාදනය**<br>• **බෑග් නිෂ්පාදනය**<br>• **ඉදල් නිෂ්පාන**<br>වැඩ සටහන් තුළින් ව්‍යවසායකයින් සවි බල ගැන්වීම සඳහා වැඩ සටහන් පැවැත්වීම. | අවශ්‍යතා සහිත ව්‍යවසායකයින් හඳුනා ගැණීමේ දුශ්කරතාව. |
| 02. පරිභොජන නිශ්පාදන හරහා ස්වභාවින සම්පත් තිරසර කලමණාකරනය සහ දේශගුණික විපයර්ාස සඳහා කඩිනම් පියවර ගනිමින් පෘථිවිය ආරක්ෂා කිරීම | • **රුක් රෝපන වැඩ සටහන**<br>පොලිතින් ප්ලාස්ටික් ඉවත් කිරිමේ වැඩ සටහන් හා පැළ බෙදා දීමේ වැඩ සටහන් පැවැත්වීම. | රෝපණය සඳහා අවශ්‍ය පැළ සපයාගැනීම |
| 03. කුසගින්න දුරලලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබා ගැනිම හා තිරසාර කෘෂිකාමරීක ප්‍රවධර්නය. | • **ගැබිණි මව් වරුන් සඳහා ඖෂධිය කැඳ වීදුරුවක් ලබා දීම** හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් වෙත කොම්පෝස්ට් පොහොර ලබා දීම. | කොට්ඨාසය තුළ සියළුම ගැබිණි මව්වරුන් සහභාගී කරවි ගැණීමට නොහැකි වීම. |
| 04.සෑම වයසකම සියලු දෙනාටම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවධර්නය කිරිම. | • **පෙරපාසල් දරුවන් සඳහා ආත්ම ආරක්ෂක වැඩ සටහනක් පැවැත්වීම**<br>• **උසස් පෙළ දරුවන් සඳහා ආකල්ප සංවධර්න වැඩ සටහනක් පැවැත්වීම.**<br>• **60 න් ඉහළ ජ්‍යෙෂ්ට පුරවැසියන් සඳහා වියපත් නොවූ සවිමත් සිතක් වැඩ සටහන ක්‍රියාත්මක කිරීම** ආදී වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම. | කොට්ඨාසය තුළ සියළුම දෙනා සහභාගී කරවි ගැණීමට නොහැකි වීම. |
| 05.සියල්ලන් සඳහා පරිපූරණ හා සාධරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවධර්ණය කිරීම. | ව්‍යවසාය සංවධර්න වැ සටහන් වරින් වර ක්‍රියාත්මක කිරීම. | කොට්ඨාසය තුළ සියළුම දෙනා සහභාගී කරවි ගැණීමට නොහැකි වීම. |
| 06.සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකි බව හා තිරසාර කළමනාකරණය සහතික කිරිම. | • **ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**<br>• **පොදු වැසිකිළි පද්ධති ක්‍රියාත්මක කිරීම.** | සීමිත සම්පත් ප්‍රමාණය හේතුවෙන් උපරිම ඵල නෙලා ලැණීමට නොහැකි වීම. |
| 07.දැරිය හැකි විශ්වසනීය, තිරසාර හා නවීනබලශක්ති සඳහා සියලු දෙනා ප්‍රෙවිශය සහතික කිරිම. | • **සිවු අවුරුදු සැළැස්ම තුලින් සූයර් බලශක්තියට ප්‍රෙවිශ වීම.**<br>• **ජීව වායු ඒකකයක් පවත්වාගන යාම.** | ප්‍රායෝගිකව සකස් කිරීමේදී අමුද්‍රව්‍ය සපයා ලැනීමේ දුශ්කරතා.<br>කාමරීක දෝශ වැඩි වීම හා මුදල්‍ය ගැටළු. |
| 08.නිරෝගී ජීවිත සහතික කර සෑම වයස් කාණ්ඩයකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවධර්නය කිරීම | • **වාෂරීකව ඩෙංගු මදර්න වැඩසටහන් 15ක් පමණ පැවැත්වීම** | ➢ අවශ්‍ය ප්‍රමාණයේ ශ්‍රමිකයින් සපයාගැනීම<br>➢ පාරසරික ගැටලු තත්ත්වයන් හේතුවෙන් |

| | | |
|---|---|---|
| | | නියමිත දිනයන්හිදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසුවීම |
| 09.පරිපූණර් සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිතකාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම | • **ආත්මාරක්ෂාව පිළිබඳ පෙර පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම**<br>(ඇහැලියගොඩ ධමර්පාල පෙර පාසල මූලිකව) | පෙරපාසල් දරුවන් සඳහා ප්‍රදානය කිරීමට නියමිතව තිබූ තිළිණ මිලදීගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයාගැනීම |
| 10.සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම | ජල මූලාශ්‍ර රැකගැනීමේ අරමුණින් සිදුකළ<br>• **රුක් රෝපණ වැඩසටහන** (බිසෝදොළ ඇල්ල ප්‍රෙද්ශය මූලිකව) | රෝපණය සඳහා අවශ්‍ය පැළ සපයාගැනීම |
| 11.සියල්ලන් සඳහා දැරියහැකි විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්තිය සැපයුම සහතික කිරීම | බල ප්‍රෙද්ශයේ ජනතාව සඳහා පවත්වන ලද<br>• **බයෝගෑස් පුහුණු වැඩසටහන** | සහභාගීවූවන් සඳහා බයෝගෑස් නිශ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| 12.සවිමත් යටතල පහසුකම් ගොඩනැගීම, පරිපූණර් සහ තිරසාර කාමරීකරණය ප්‍රවධර්නය කර නව්‍යකරණය දිරිගැන්වීම | • ආදාහනාගාර සේවා ලබාදීම ආරම්භ කිරීම හා එම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම | ජනතාව වෙත සේවය ලබාදීමේ විවිධ අවස්ථාවන්හි දී තාක්ෂණික ගැටලු ඇතිවීම |
| | • GIS තාක්ෂණය යටතේ සභා බල ප්‍රෙද්ශයේ මාගර් සිතියම්ගත කිරීමේ වැඩසටහන සඳහා මාගර් ට්‍රැකින් කිරීම හා එම මාගර් සිතියම්ගත කිරීම | ➢ මාගර් ට්‍රැකින් කිරීම සඳහා අවශ්‍ය වූ පහසුකම් සහිත තාක්ෂණික උපාංග (ජංගම දුරකථන) අවමවීම<br>➢ බල ප්‍රෙද්ශයේ ඇතැම් මාගර් ට්‍රැකින් කිරීම සඳහා එම මාගර් වෙත ප්‍රායෝගිකව ළඟාවීම දැඩි දුෂ්කර වීම |
| 13. දේශගුණික විපයර්‍යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාගර් ගැනිම. | • ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දි භූමි යෝග්‍යතා සහතිකය අනිවායර් කිරිම.<br>• ආපදා අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් කායර්ාලය හා එක්ව ජනතාව දැනුවත් කිරීම හා හදිසි ආපදා තත්ව වලදී අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා සේවකයින් ලබා දීම.<br>• නියං සමයේ දී ජල අවශ්‍යතාව සඳහා ජල බවුසර් ලබා දිම. | අදාල ස්ථානයට ළඟා වීමේ දුශ්කරතාව<br>සන්නිවේදන දුවර්ලතා |

## හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100 % |
| 01.නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම | කාලීනව පැන නගින බෝවන රෝග පාලනය | නොසලකා හරින ලද සමර් කලාපීය රෝග සඳහා සෞඛ්‍යමය මැදිහත්වීමක් අවශ්‍ය පුද්ගලයින් සංඛ්‍යාව | | | √ |
| 02.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිතකාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම | පූර්ව ළමාවිය සංවර්ධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | ස්ත්‍රී, පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාගර්යකට අවතීර්ණව සිටින වයස අවු.5ට අඩු ළමුන්ගේ ප්‍රමාණය | | | √ |
| 03.සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම | ජල පෝෂක ප්‍රදේශ හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම | සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිත කරන ජනගහනයේ ප්‍රමාණය | | | √ |
| 04.සියල්ලන් සඳහා දැරියහැකි විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්තිය සැපයුම සහතික කිරීම | බයෝ ගෑස් නිශ්පාදනය සඳහා හුරුකිරීම තුළින් ගෘහස්ථව කසල කළමනාකරණයට ප්‍රජාව හුරු කිරීම | සමස්ත අවසන් බලශක්ති පරිභෝජනයෙන් පුනජර්නනීය බලශක්ති පංගුව | | | √ |
| 05.සවිමත් යටතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාමරීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම | විධිමත් මාගර් පද්ධතියක් ඇතිකිරීම | වසර පුරා භාවිතා කළ හැකි මාගර්යක සිට කි.මී. 2ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය | | √ | |

## අනුකූලතා වාර්තාව

| | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කරණ ක්‍රියාමාගර් |
|---|---|---|---|---|
| 1. | **මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම** | | | |
| (1.1) | සමාලෝචිත වසර සඳහා මූල්‍ය ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 2. | **විගණනය සඳහා ප්‍රතිචාර දැක්වීම** | | | |
| (2.1) | විගණකාධිපතිවරයා විසින් නියම කරන ලද දිනට විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| (2.2) | ඉකුත් වසරවල විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන විමසුම් විගණන ඡේදවල පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගෙන තිබීම | අනුකූල වේ. | | |
| 3. | **සැලසුම්** | | | |
| (3.1) | ආයතනයේ වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| (3.2) | සමාලෝචිත වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට අනුමත කර ගෙන තිබීම. | අනුකූල වේ. | | |
| (3.3) | සමාලෝචිත වසර සඳහා අයවැය අනුමත කොට ගෙන තිබීම. | අනුකූල වේ. | | |
| (3.4) | වාෂරීක ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 4. | **ගාස්තු පරිපාලනය** | | | |
| (4.1) | ගාස්තු අය කරනු ලබන දේපළ වසර 05 කට වරක් තක්සේරු කොට තිබීම. | අනුකූල නොවේ. | පසු ගිය කාල වල දී සිදු වූ කාලීන ව්‍යවසන හේතුවෙන් මග හැරී ඇත. | දැවනට 2024 වෂර්යේ සිට තක්සේරු කිරීම සිදු කරගන යමින් පවතී. |
| (4.2) | සමාලෝචිත වසර සඳහා බිල් ගත කර ඇති ආදායමෙන් 70% එම වසර තුළ දීම එකතු කර ගෙන තිබීම | අනුකූල නොවේ. | පසු ගිය කාල වල දී සිදු වූ කාලීන ව්‍යවසන හේතුවෙන් මග හැරී ඇත | අමතර නිලධාරීන් යොදවා ආදියම් එක් රැස් කිරීමේ සේවාවක් පවත්වාගන යයි. |
| (4.3) | හිඟ හිටි ගාස්තු අය කරවා ගැනීම සඳහා වොරන්ට් බලපත්‍ර නිකුත් කොට තිබීම. | අනුකූල නොවේ | පසු ගිය කාල වල දී සිදු වූ කාලීන ව්‍යවසන හේතුවෙන් මග හැරී ඇත | ඉදිරියේ දී කරගන යාමට අපේක්ෂිතයි. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | **කුලී පරිපාලනය** | | | |
| (5.1) | වාෂරීකව කුලියට දී තිබෙන සියලු ම දේපළ (මස් වෙළෙඳසැල්/මාලු වෙළෙඳසැල්/ පොදු සති පොළවල්) සමාලෝචිත වසර තුළ දී කුලියට දී තිබීම | අනුකූල වේ | | |
| (5.2) | වාෂරීකව කුලියට දෙනු ලබන දේපළ සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ තිබීම. | අනුකූල වේ | | |
| (5.3) | වාෂරීකව කුලියට දෙනු ලබන දේපළ වලින් අයවිය යුතු බදු අයකර ගෙන තිබීම. | අනුකූල වේ | | |
| (5.4) | හිඟ හිටි මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාගර් ගෙන තිබීම. | අනුකූල වේ | | |
| (5.5) | දීඝර් කාලයක් සඳහා කුලියට දීමට නියමිත ව තිබූ දේපළ (පොදු වෙළඳපොළ /කඩ) කුලියට දි තිබීම. | අනුකූල වේ | | |
| (5.6) | දිඝර් කාලයක් සඳහා කුලියට දීමට නියමිත ව තිබූ දේපළ සම්බන්ධයෙන් ගිවිසුම් වලට එළඹ තිබීම | අනුකූල වේ | | |
| 6. | **ව්‍යාපාර බදු සහ වෙළෙඳ බලපත්‍ර පරිපාලනය** | | | |
| (6.1) | සමාලෝචිත වෂර්ය තුළ ව්‍යාපාරික බදු හා වෙළෙඳ බලපත්‍ර ගාස්තු එකතු කිරීමට සමීක්ෂණයක් පවත්වා තිබීම. | අනුකූල වේ | | |
| (6.2) | බලපත්‍ර ලබාගෙන නොමැති ව්‍යාපාරික ස්ථානවලට එරෙහිව නඩු පවරා තිබීම. | අනුකූල නොවේ. | ලබා නොගත් අයවලුන් හඳුනාගන නැත. | |
| 7. | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| (7.1) | අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වෂර්ය තුළ පවත්වා තිබීම. | අනුකූල වේ | | |
| 8. | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| (8.1) | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කර තිබීම. | අනුකූල වේ | | |
| (8.2) | සමාලෝචිත වෂර්යේ දී හෝ ඊට පෙර වෂර් වල සිට නැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| (8.3) | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා සැලසුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කොට තිබීම. | අනුකූල වේ | | |
| 9 | **වත්කම් කළමනාකරණය** | | | |
| (9.1) | සියලු වත්කම් ලේඛන ගත කොට තිබීම. | අනුකූල වේ | | |
| (9.2) | සියලු ම වත්කම්වල ආරක්ෂාව තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| (9.3) | සියලු වත්කම් අත්පත් කර ගෙන තිබීම. | | | |

| | | | | |
|---|---|---|---|---|
| (9.4) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වන ලද අතර, අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ | | |
| (9.5) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිදෙර්ශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| (9.6) | ගහරීත භාණ්ඩ අපහරණය කිරීම මු .රෙ. 772 අනුව සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| **10.** | **වාහන කළමනාකරණය** | | | |
| (10.1) | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ | | |
| (10.2) | වාහන ගහරීත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කොට තිබීම. | අනුකූල නොවේ | - | අපහරනය කරමින් පවතී. |
| (10.3) | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කොට තිබීම. | අනුකූල වේ | | |
| (10.4) | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කොට තිබීම. | අනුකූල වේ | | |
| (10.5) | 2016. 12 .29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කොට තිබීම. | අනුකූල වේ | | |
| (10.6) | ආයතනයේ වාහන නඩත්තු ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| (10.7) | ආයතනයේ ඉන්ධන ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **11.** | **කායර් මණ්ඩල කළමනාකරණය** | | | |
| (11.1) | අනුමත කායර් මණ්ඩල සීමාව තුළ කායර් මණ්ඩලය බඳවාගෙන ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| (11.2) | කායර් මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| (11.3) | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාතර්ා කළමනාකාර සේවා දෙපාතර්මෙන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12. | **නවතම යාවත්කාලීන කිරීම් සහිතව පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම** | | | |
| (12.1) | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය. | අනුකූල වේ | | |
| (12.2) | ස්ථාවර වත්කම් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.3) | කොන්ත්‍රාත් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.4) | විගණන විමසුම් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.5) | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.6) | ඉන්වෙන්ට්‍රි ලේඛනය. | අනුකූල වේ | | |
| (12.7) | පාරිභෝගික භාණ්ඩ ලේඛනය. | අනුකූල වේ | | |
| (12.8) | හානි හා පාඩු ලේඛනය. | අනුකූල වේ | | |
| (12.9) | උප පත්‍රිකා පොත් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.10) | අත්තිකාරම් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.11) | කමර්ාන්ත / ව්‍යාපාරික බදු ලේඛනය. | අනුකූල වේ | | |
| (12.12) | ණයගැති ලේඛනය. | අනුකූල වේ | | |
| (12.13) | ණයහිමි ලේඛනය. | අනුකූල වේ | | |
| (12.14) | ටෙන්ඩර් මණ්ඩල තීරණ ලේඛනය. | අනුකූල වේ | | |
| (12.15) | වීදි ලාම්පු ලේඛනය. | අනුකූල වේ | | |
| (12.16) | මැණුම් පොත. | අනුකූල නොවේ | දැනට භාවිතයට නොගනී. | |
| (12.17) | මාගර් ලේඛනය. | අනුකූල වේ | | |
| (12.18) | ඉඩම් කට්ටි බදු ලේඛනය. | අනුකූල වේ | | |
| (12.19) | ගොඩනැගිලි අයදුම් පත්‍ර ලේඛනය. | අනුකූල වේ | | |
| (12.20) | අනුකූලතා ඇගයුම් ලේඛනය. | අනුකූල වේ | | |
| 13. | **අපද්‍රව්‍ය කළමනාකරණය** | | | |
| (13.1) | ජාතික ප්‍රතිපත්ති අනුව අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| (13.2) | කුණු කසළ වෙන් කොට සභා සීමාව තුළ එකතු කර තිබීම. | අනුකූල වේ | | |
| 14. | **පාරිසරික කටයුතු** | | | |
| (14.1) | ප්‍රදේශය තුළ අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම හේතුවෙන් පරිසරයට හානි වී නොතිබීම. | අනුකූල වේ | | |
| (14.2) | ප්‍රදේශයේ කමර්ාන්තශාලා වලින් පිටවන අහිතකර අපද්‍රව්‍ය වලින් පරිසරයට සිදුවන හානිය පාලනය කර ගැනීමට ක්‍රියාමාගර් ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 15. | අතුරු ව්‍යවස්ථා | | | |
| (15.1) | මහ නගර සභා, ප්‍රාදේශීය සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ යුතු කායර්යන් | | | |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට තිබීම. | | | |
| (15.2) | ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් සභාව විසින් සිදු කළ යුතු ක්‍රියාකාරකම් වාෂරීක කාශර් සාධන වාතර්‍ාවේ සඳහන් කොට තිබීම. | අනුකූල වේ | | |
| (15.3) | එම ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා වාෂරීක අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කොට තිබීම. | අනුකූල වේ | | |
| **16.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| (16.1) | තොරතුරු දැනගැනීමේ පනත අනුව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ නිසි ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබීම. | අනුකූල වේ | | |
| (16.2) | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාගර් හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | | සකස්කරමින් පවතී2024 වෂර්යට අදාලව |
| (16.3) | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හා වසරකට වරක් වාතර්‍ා ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **17.** | **ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම** | | | |
| (17.1) | සභාවට ලැබෙන සියලු ම ගොඩනැගිලි සැලසුම් වාතර්‍ා කිරීමට ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| (17.2) | අයදුම්පත් වල ගැටලු සම්බන්ධයෙන් දින 05ක් ඇතුළත අදාළ පුද්ගලයන්ට දැනුම් දී තිබීම. | අනුකූල වේ | | |
| (17.3) | අයදුම්පත ලැබීමෙන් සතියක් ඇතුළත පවත්වනු ලබන සැලසුම් කමිටුවේ ප්‍රථම රැස්වීමට අයදුම්පත් ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ | | |
| (17.4) | පුරවැසි ප්‍රඥප්තියෙහි සඳහන් නියමිත දිනට (සති 8ක් තුළ) ගොඩනැගිලි සැලසුම් වලින් 80% කට වඩා අනුමත කොට තිබීම. | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| (18.1) | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කොට තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| (18.2) | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| (19.1) | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| (19.2) | කායර් මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වෂර්යකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| (19.3) | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කායර් මණ්ඩලය සඳහාම වාෂර්ික කායර් සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| (19.4) | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවධර්න සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවධර්න වැඩසටහන් සංවධර්නය කිරීම, නිපුණතා සංවධර්න වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල නොවේ | | ඉදිරියේ දි සිදු කිරීමට නියමිතය. |
| **20.** | **විද්‍යුත් - පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම** | අනුකූල නොවේ | | ඉදිරියේ දි සිදු කිරීමට නියමිතය |
| (20.1) | 2018.07.19 දිනැති පළාත් පාලන චක්‍ර ලේඛ අංක 2018/ e- Local Government – 01 අනුව අන්තජර්ාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | | ඉදිරියේ දි සිදු කිරීමට නියමිතය |
| (20.2) | අන්තජර්ාලය හරහා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | | ඉදිරියේ දි සිදු කිරීමට නියමිතය |
| (20.3) | පාරිභෝගිකයින්ට හිතකර සේවාවක් සැපයීම සඳහා පෙරටු කායර්ාල (Front Offices) හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හඳුන්වා දී තිබීම. | අනුකූල නොවේ | | ඉදිරියේ දි සිදු කිරීමට නියමිතය |

# 06. අපගේ ජයග්‍රහණ




ඇහැලියගොඩ නගරය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ගමන් ඉතිහාසයේ අප මුහුණ දුන් අභියෝග රැසකි. එම අභියෝග හමුවේ රාජ්‍ය සේවකයන් ලෙස අප එකාවන් ව හා එක් සිත්ව නොසැලී කටයුතු කර ලැබූ ජයග්‍රහණ මෙසේ එළි දැක්විය හැකි ය.









2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා කුසලතා සම්මානය ලබාගැනීම

**07. මූල්‍ය වාර්තා**

01. විගණකාධිපති වාර්තාව
02. ආදායම් වියදම් ගිණුම
03. ගිණුම්කරණ ප්‍රතිපත්ති
04. මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය/මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
05. ගිණුම්කරණ සටහන්
06. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
07. ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය


ලංකා සතොස
LANKA SATHOSA
Dealer for JINASENA LTD
CALTEX
Authorized Dealer

ඇහැලියගොඩ නගරය

(87)

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | SGLG/RT/A/EHPS/FA/$A_1$/05/2023/13 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2024 මැයි 16 දින. |

ප්‍රාදේශීය සභා
29 MAY 2024
ඇහැලියගොඩ

ලේකම්,

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

වී.පී.එම්. කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | SGLG/RT/A/EHPS/FA/A$_1$/05/2023/13 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024 මැයි 16 දින. |

ලේකම්,

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.265,981ක් ගිණුම්ගත කර නොතිබීමෙන් ජංගම බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණු අතර ප්‍රාග්ධන වියදම රු.250,468කින් හා පුනරාවර්තන වියදම රු.15,512කින් අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සබරගමුව පළාත් සභාවෙන් පරිත්‍යාග වශයෙන් ලද රු.950,000ක් වටිනාකමැති බෙලර් යන්ත්‍රය ප්‍රාග්ධනිත කිරීමේදී ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම වෙනුවට සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුම බැර කර තිබුණි. එබැවින්, එම ගිණුම් දෙක සමාන වටිනාකමින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් රු.27,400ක් වටිනාකමැති ලී බඩු හා උපකරණ සහ රු.36,100ක් වටිනාකමැති යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.63,700කින් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැය කරන ලද රු.701,020ක් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) ගිණුම් විෂයයන් 06කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.85,709,469ක වෙනසක් විය.

(ඊ) එකතුව රු.163,610,295ක් වූ ගිණුම් විෂයයන් 08ක විස්තරාත්මක උපලේඛන සහ වෙනත් මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කිරීමට නොහැකි විය.

(උ) තැන්පතු ගිණුම් 03ක පවතින එකතුව රු.8,842,547ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ ලිඛිත තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (5) | 1995 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 41ක දී ලබා දී තිබුණු රු.1,902,321ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ආ) | 2017 ජුලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) | 2018 ජුලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභීන්ට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,583,957ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,070,807ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,029,000 | 9,479,891 | 11,816,631 | 24,400,450 | 8,561,500 | 10,595,823 | 8,778,931 | 26,327,278 |
| කුලී | 11,652,500 | 12,285,671 | 12,088,896 | 1,313,907 | 12,107,800 | 11,873,166 | 11,742,288 | 1,282,271 |
| බලපත්‍ර ගාස්තු | 1,257,600 | 936,780 | 936,780 | 1,000 | 1,072,600 | 725,135 | 723,885 | 5,250 |
| වෙනත් ආදායම් | 9,926,100 | 11,043,888 | 9,332,714 | 3,258,189 | 7,378,300 | 7,233,149 | 6,248,096 | 1,961,071 |
| | 32,865,200 | 33,746,230 | 34,175,021 | 28,973,546 | 29,120,200 | 30,427,273 | 27,493,200 | 29,575,870 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.29,575,870ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.33,746,230ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.63,322,100ක් වුවද, රැස් කරන ලද ආදායම රු.34,175,021ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 46ක මට්ටමක පැවතිණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බදු කුළී ආදායම සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 18කින්, 04කින් සහ 07කින් වැඩි වී තිබුණු අතර, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ සහ රජයේ ආයකත්වය යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 26කින් සහ 30කින්, 38කින් හා 21කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.23,425,418ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.16,712,820ක් වූ වරිපනම් ඒකක 2442ක් ඇතුළත් වී තිබුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.191,562ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 05කට වඩා වැඩි කාලයක සිට පැවැත එන ඒකක 344කින් අයවිය යුතු රු.191,141ක් ඇතුළත් වී තිබුණි.

(ඇ) ජල පාරිභෝගිකයින් 107 දෙනෙකුගෙන් සමන්විත ජල ව්‍යාපෘති 02ක් මගින් බෙදාහරින ජලයෙහි ගුණත්වය සම්බන්ධයෙන් තත්ත්ව පරීක්ෂණයක් සිදුකර නොතිබීම හේතුවෙන් එම ජලය බිමට සුදුසු තත්ත්වයෙන් පවතිද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. එමෙන්ම, එම පාරිභෝගිකයින් 107 දෙනාගෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තු රු.156,397ක් අයකරගෙන නොතිබුණි.

2.2.4 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 01ත් 03ත් අතර කාලයක් හිඟහිටි කඩකුලී, සතිපොළ හා පදික වෙළඳාම් ගාස්තු රු.1,111,393ක් අයකර නොතිබුණි.

(ආ) ඇහැලියගොඩ සතිපොළෙන් 2012 වර්ෂය වෙනුවෙන් හිඟහිටි බදු කුලී, අධිකරණ තීන්දුවකට අනුව 2016 අප්‍රේල් වනවිට ගෙවා නිමකළ යුතු වුවද, රු.180,000ක් තවදුරටත් අය වීමට පැවැතිණි. එහෙත්, බදුකරුවන් විසින් අධිකරණ නියෝග නොපිළිපැදීමට එරෙහිව අධිකරණය දැනුවත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුළ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතනයකින් 2022 වර්ෂයේ පිරිවැටුම මත අයකළ යුතු ගාස්තු රු.11,516ක් අඩුවෙන් අයකර තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කොට තිබුණු දුරකථන කුළුණු 14කින් වාර්ෂිකව අයවිය යුතු ව්‍යාපාර බදු එම කුළුණු අනුමත කළ 2004 සිට 2021 දක්වා වූ වර්ෂවල සිට අයකර නොතිබීමෙන් රු.525,000ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) ප්‍රදර්ශිත දැන්වීම් පුවරු හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. මේ නිසා අයකළ දැන්වීම් පුවරු ගාස්තුවල නිවැරදිතාව තහවුරු කරගත නොහැකි විය. එමෙන්ම, දැන්වීම් පුවරු 07ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.16,248ක් අයකර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.16,735,306ක් හා මුද්දර ගාස්තු රු.2,462,503ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) පාරිසරික ගැටලු

(i) බල ප්‍රදේශයේ ජල මූලාශ්‍ර 21ක ජලය පරිභෝජනය සඳහා නුසුදුසු බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් ප්‍රාදේශීය සභාව දැනුවත් කර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ii) ඇහැලියගොඩ පොළ භූමියේ ඇති වැසිකිළියේ පූතික ටැංකිය උතුරා යාම වැළැක්වීම සඳහා 2019 මැයි මස රු.375,000ක් වැයකර අලුත්වැඩියාකර තිබුණි. එහෙත්, එය නිසි පරිදි ඉටු නොකිරීම නිසා 2023 වර්ෂයේදී රු.171,393ක ඇස්තමේන්තුගත මුදලකට නැවත අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පැවැතිණි. එමෙන්ම, 2013 හා 2014 වර්ෂවල දී පරිත්‍යාග ලෙස ලද ගලි බවුසර් 02ක් ඒවා ලද දිනයේ සිටම අභාවිතව දිරාපත් වෙමින් පැවතියදී, 2022 හා 2023 වර්ෂවලදී රු.148,000ක් වැයකර පෞද්ගලික ගලි රථයක සේවය ලබා ගෙන තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ ගාල් රැසක් පැවතියද, ඒවා නියාමනය කර ගාස්තු අයකිරීමට හා ඒ සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2017 මාර්තු 31 දින මිල දී ගෙන ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු ජල බවුසරයේ මෝටරය 2018 සැප්තැම්බර් මස අස්ථානගත වී තිබුණි. ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා කමිටුවක් පත්කිරීම 2023 අප්‍රේල් දක්වා ප්‍රමාද වී තිබුණු අතර පරීක්ෂණයෙන් අනතුරුව ගන්නා ලද පියවර කිසිවක් විගණනයට අනාවරණය නොවිය.

(ආ) පවරා නොගත් වත්කම්

භූමි ප්‍රමාණය අක්කරයක් වූ ඇහැලියගොඩවත්ත ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් පුස්සැල්ලාව වැවිලි සමාගමට ගෙවිය යුතු වන්දි මුදල් 2011 වර්ෂයේදී ගෙවා අවසන් කර තිබුණ ද, රු.98,735ක පොලී මුදලක් ගෙවීම ප්‍රමාද වීම නිසා 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

82

(ඇ) වාහන උපයෝජනය

වැඩ බලන සභාපතිවරයා විසින් රැගෙන ගිය සභාවට අයත් කැබ් රථයක් 2022 ජූලි 19 දින උඩවලව ප්‍රදේශයේදී අනතුරට පත්ව තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව, එදින එම රථය ඇහැලියගොඩ සිට ඇඹිලිපිටිය හරහා අම්බලන්තොට දක්වා ගමන් කර ඇති බවත්, එය රාජකාරී කටයුත්තක් ද යන්න තහවුරු කරගත නොහැකි වූ බවත් දක්වා තිබුණි. සභාපතිවරයාගෙන් ප්‍රකාශ ලබා ගැනීමට අවස්ථා 04කදී උත්සාහ දරා ඇතත්, ඔහු ඒ සඳහා සහභාගී වී නොමැති බැවින් ඔහුගෙන් ඒ පිළිබඳ ලිඛිතව කරුණු විමසිය යුතු බවට නිර්දේශ කර තිබුණද, එවැනි කරුණු විමසීමක් මේ දක්වා සිදුකර නොතිබුණි. මෙම ගමන සඳහා ඉන්ධන ලීටර 44ක් භාවිතා කර තිබුණු අතර අලුත්වැඩියාව සඳහා වැය වූ මුදලින් රු.18,950ක් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 වර්ෂයේදී රු.945,000ක් වැයකර ඇහැලියගොඩ පොළෙහි පිවිසුම් ගේට්ටුව සහ ආරක්ෂිත තාප්පය ඉදිකර තිබුණි. නමුත් පොළ භූමියට බස් රථ ඇතුල් කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා සභාපතිවරයාගේ තීරණය මත තාප්පයෙන් මීටර් 11ක ප්‍රමාණයක් සහ මීටර් 05ක ගේට්ටුව 2023 ජනවාරි මස ඉවත් කර තිබුණි. ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර සැලසුම් සහගතව කටයුතු කර නොතිබීම නිසා එම කොටස ඉදිකිරීම සඳහා වැය කර තිබුණු රු.252,631ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) 2022 වර්ෂයේදී සභාවේ ට්‍රැක්ටර් රථයක් හා පෞද්ගලික ලොරි රථයක් ගැටීමෙන් ඉහත සඳහන් තාප්පයට හානි සිදු වී තිබුණි. ඒ වෙනුවෙන් රු.37,500ක් එම රියදුරන්ගෙන් අයකරගෙන තිබුණද, 2023 වර්ෂයේදී තාප්පයේ කොටසක් කඩා ඉවත්කිරීම නිසා සභාවේ රියදුරුගෙන් අයකරගත් රු.22,500ක් ආපසු ඔහු වෙත ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 08කට අදාලව එකතුව රු.11,710,300ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 10කට අදාළව එකතුව රු.11,417,300ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ඩී.පී.එම්. කුමානායක.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

## <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

සභාවේ 2023.12.31 දිනට පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණතේ 171 වැනි වගන්තියට අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභා උප නීතින් වශයෙන් සම්මත ප්‍රාදේශීය සභා මූල්‍ය රීතීන් වලට අනුගත වෙමින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී උපචිත පදනම මත ගිණුම් තැබීම කර ඇති අතර මුද්දර ගාස්තු ආදායම සඳහා පමණක් මුදල් පදනමින් ගිණුම් සකස් කර ඇත.

සභාවේ ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත නිර්දේශවලින් බැහැරව වත්කම් ගත් වර්ෂයේ 100% ක්ෂය වූවා සේ සලකා මුළු පිරිවැය ආදායම් වියදම් ගිණුමට ප්‍රාග්ධන වියදම් ගිණුමට ප්‍රාග්ධන වියදම් යටතේ ලියා අතහැර ඇති අතර අදාල වත්කම් ශේෂ පත්‍රයේ නිරූපනය කිරීම සඳහා අදාල වත්කම් ගිණුමට සිහිවටන සටහනක් මගින් ගැළපීම් සිදුකර ඇත.

මහා භාණ්ඩාගාරය මගින් නිකුත් කරන ලද 1994.12.19 දිනැති PED/19 නැමැති චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය අංශ ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශන සංශෝධන සහිතව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා භාවිතා කර ඇත.

ආදායම් වියදම් ගිණුම -මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය නමින් සඳහන් කර ඇත.

ශේෂ පත්‍රය -මූල්‍ය තත්ත්ව ප්‍රකාශය නමින් සඳහන් කර ඇත.

සභාවේ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී මුදලේ උද්ධමනකාරී තත්ත්වය හෝ අවධමනකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන නොමැත.මෙම මූල්‍ය ප්‍රකාශන වලින් දැක්වෙන සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.

සභාපති

ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාව

පී.ආර්.සී.කේ.ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිළධාරී
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

| විස්තරය | සටහන | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| මෙහෙයුම් අයභාරය | | | |
| රජයේ දායකත්වය පුනරාවර්තන | 1 | 45,598,444.04 | 51,667,214.14 |
| වෙනත් අයභාර | 2 | 83,712,296.36 | 37,927,273.08 |
| | | 129,310,740.40 | 89,594,487.22 |
| මෙහෙයුම් වියදම | | | |
| පුනරාවර්තන වියදම | 3 | 91,726,783.12 | 87,523,679.61 |
| | | 91,726,783.12 | 87,523,679.61 |
| | | | |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 3,034,289.01 | 13,659,974.09 |
| | | 3,034,289.01 | 13,659,974.09 |
| | | | |
| ප්‍රාග්ධන වියදම | 5 | 10,909,880.71 | 14,739,766.85 |
| | | 10,909,880.71 | 14,739,766.85 |
| | | | |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌනතාවය | | 29,708,365.58 | 991,014.85 |

## 2023 .12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ | 6 | 167,339,332.30 | 163,843,403.50 |
| එකතුව | | 167,339,332.30 | 163,843,403.50 |
| | | | |
| ජංගම වත්කම් | | | |
| තොග | 7 | 872,963.09 | 1,378,713.96 |
| සේවක ණය | 8 | 13,955,786.46 | 10,604,829.80 |
| ලැබියයුතු දෑ | 9 | 156,254,178.34 | 138,273,113.81 |
| ආයෝජන | 10 | 38,985,076.35 | 26,926,366.82 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 29,983,438.14 | 20,590,836.72 |
| එකතුව | | 240,051,442.38 | 197,773,861.11 |
| මුළු වත්කම් | | 407,390,774.68 | 361,617,264.61 |
| | | | |
| | | | |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 13,462,037.80 | 8,412,586.74 |
| ජංගම වගකීම් | 13 | 21,725,463.30 | 23,537,649.43 |
| හිමිකම | 14 | 372,203,273.58 | 329,667,028.44 |
| මුළු හිමිකම | | 407,390,774.68 | 361,617,264.61 |

ලේකම් ..............................

ටී.ආර්.සී.ජේ. ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

| අය විෂයයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතිකසැලසුම්,මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි | ජලසේවා | වෙනත් උපයෝගී සේවා | සුභසාධන සේවා | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| සටහන 01 | | | | | | | | |
| රජයේ දායකත්වය පුනරාවර්තන | | | | | | | | |
| 70.පළාත් සභා/රජයේ දායකත්ව | 28,722,177.88 | 9,102,453.43 | 2,373,592.26 | + | 515,760.00 | 4,884,460.47 | 45,598,444.04 | 51,667,214.14 |
| එකතුව | 28,722,177.88 | 9,102,453.43 | 2,373,592.26 | 0.00 | 515,760.00 | 4,884,460.47 | 45,598,444.04 | 51,667,214.14 |
| සටහන 02 | | | | | | | | |
| වෙනත් අයභාර (පුනරාවර්තන ආදායම්) | | | | | | | | |
| 10.වරිපනම් හා බදු | 7,820,989.12 | 592,828.40 | 70,727.50 | 352,840.00 | + | 642,505.63 | 9,479,890.65 | 10,595,823.08 |
| 20.කුලී | + | + | 242,400.00 | 58,020.80 | 11,817,275.45 | 167,975.00 | 12,285,671.25 | 11,873,165.86 |
| 30.බලපත්‍ර ගාස්තු | 518,530.00 | 418,250.00 | + | + | + | + | 936,780.00 | 725,134.50 |
| 40.සේවා සඳහා ගාස්තු | 275,650.00 | 1,559,250.00 | 467,164.43 | 6,000.00 | + | 37,900.00 | 2,345,964.43 | 1,989,743.48 |
| 50.වරෙන්තු ගාස්තු හා දඩ | 11,492,521.52 | + | 157,529.00 | + | 302,504.50 | 64,106.38 | 12,016,661.40 | 9,145,324.49 |
| 60.වෙනත් ආදායම් | 44,101,805.26 | 101,915.00 | 147,828.84 | 10,000.00 | 2,284,214.53 | 1,565.00 | 46,647,328.63 | 3,598,081.67 |
| එකතුව | 64,209,495.90 | 2,672,243.40 | 1,085,649.77 | 426,860.80 | 14,403,994.48 | 914,052.01 | 83,712,296.36 | 37,927,273.08 |

ලේකම්

වී.ආර්.සී.ජේ.ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

| අය විෂයයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතිකසැලසුම් මං මාවත්,ඉඩම් හා ගොඩනැගිලි | ජලසේවා | වෙනත් උපයෝගී සේවා | සුභසාධන සේවා | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| සටහන- 03 | | | | | | | | |
| පුනරාවර්තන වියදම් | | | | | | | | |
| 1.වැටුප් හා වේතන | 29,994,699.87 | 18,670,425.78 | 3,123,795.39 | 30,312.00 | 1,849,663.17 | 4,971,971.06 | 58,640,867.27 | 64,191,252.95 |
| 2.ගමන් වියදම් | 1,176,208.00 | 229,283.50 | 164,723.50 | | 44,756.50 | 38,640.00 | 1,653,611.50 | 860,348.99 |
| 3.සැපයුම් හා උපකරණ | 5,302,072.70 | 4,843,624.87 | 542,970.00 | | 2,187,985.00 | 346,150.00 | 13,222,802.57 | 11,582,376.92 |
| 4.ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 2,597,164.23 | 1,997,108.00 | 2,897,672.18 | 118,148.00 | 270,445.00 | 7,400.00 | 7,887,937.41 | 4,035,111.45 |
| 5.ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 3,791,984.39 | 2,266,716.72 | 552,337.78 | 260,105.51 | 368,786.54 | 293,046.12 | 7,532,977.06 | 4,321,800.45 |
| 6.පොලී ගෙවීම් ලාභාංශ හා පුසාද මුදල් | . | | | 0.00 | 948,211.10 | | 948,211.10 | 986,919.30 |
| 7.ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 528,511.21 | 4,650.00 | | 0.00 | 0.00 | 170,000.00 | 703,161.21 | 4 55,649.55 |
| 8.විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා දායක මුදල් | 42,493.00 | 963,130.00 | | 0.00 | 113,092.00 | 18,500.00 | 1,137,215.00 | 1,090,220.00 |
| එකතුව | 43,433,133.40 | 28,974,938.87 | 7,281,498.85 | 408,565.51 | 5,782,939.31 | 5,845,707.18 | 91,726,783.12 | 87,068,030.06 |
| සටහන 04 | | | | | | | | |
| 80.ප්‍රාග්ධන ආධාර | | 1,842,046.01 | 843,077.25 | | 349,165.75 | | 3,034,289.01 | 13,659,974.09 |
| එකතුව | | 1,842,046.01 | 843,077.25 | | 349,165.75 | | 3,034,289.01 | 13,659,974.09 |
| සටහන 05 | | | | | | | | |
| 9.ප්‍රාග්ධන වියදම් | 854,379.51 | 1,199,283.71 | 39,483.50 | - | 2,152,118.49 | 667,527.00 | 4,912,792.21 | 1,403,684.97 |
| 9.මූලධන වියදම් | | | 5,804,545.52 | | | 192,542.98 | 5,997,088.50 | 13,336,081.88 |
| එකතුව | 854,379.51 | 1,199,283.71 | 5,844,029.02 | | 2,152,118.49 | 860,069.98 | 10,909,880.71 | 14,739,766.85 |

ලේකම්

ටී.ආර්.සී.ජේ.ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ සටහන්

| විස්තරය | 2023 01.01 දිනට පිරිවැය | 2023 එකතු කිරීම | 2023 ඉවත් කිරීම | 2023.12.31.දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| සටහන -6 | | | | | |
| දේපල පිරියත හා උපකරණ | | | | | |
| 111.ඉඩම හා ගොඩනැගිලි | 58,719,477.91 | 0 | 0 | 58,719,477.91 | 58,719,477.91 |
| 112.යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 62,252,560.12 | 2727565 | 31550 | 64,948,575.12 | 62,252,560.12 |
| 113.මෝටර් රථ හා කරත්ත | 33,759,511.68 | 0 | 9750 | 33,749,761.68 | 33,759,511.68 |
| 114.ලී බඩු හා සවිකිරීම් | 4,066,908.45 | 179600 | 22740 | 4,223,768.45 | 4,066,908.45 |
| 115.පුස්තකාල පොත් | 5,044,945.34 | 661477 | 8673.2 | 5,697,749.14 | 5,044,945.34 |
| එකතුව | **163,843,403.50** | **3568642** | **72713.2** | **167,339,332.30** | **163,843,403.50** |
| සටහන- 7 තොග | | | | | |
| 121 .ආයුර්වේද ඖෂධ තොග | 1,378,713.96 | 356690 | 862440.87 | 872,963.09 | 1,378,713.96 |
| එකතුව | **1,378,713.96** | **356690** | **862440.87** | **872,963.09** | **1,378,713.96** |
| සටහන-8 | | | | | |
| සේවක ණයගැති හා අත්තිකාරම් | | | | | |
| 140 සේවක ණය | 10,604,829.80 | 7,876,278.00 | 4,525,321.34 | 13,955,786.46 | 10,604,829.80 |
| එකතුව | **10,604,829.80** | **7,876,278.00** | **4,525,321.34** | **13,955,786.46** | **10,604,829.80** |
| සටහන-9 ලැබියයුතු දෑ | | | | | |
| 161.හිඟහිටි වරිපනම් බදු | 26,328,277.30 | 9,725,681.73 | 11,653,509.40 | 24,400,449.63 | 26,328,277.30 |
| 162.හිඟහිටි ප්‍රාග්ධන ආධාර | 88,625,575.94 | 296,104.73 | 5,814,446.55 | 83,107,234.12 | 88,625,575.94 |
| 163.හිඟහිටි වෙනත් ආදායම් | 20,024,622.69 | 88,529,398.06 | 61,740,847.29 | 46,813,173.46 | 20,024,622.69 |
| 172.පෙර ගෙවුම්(අත්තිකාරම්) | 3,294,637.88 | 1,914,500.53 | 3,275,817.28 | 1,933,321.13 | 3,294,637.88 |
| අගරු අත්තිකාරම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| එකතුව | **138,273,113.81** | **100,465,685.05** | **82,484,620.52** | **156,254,178.34** | **138,273,113.81** |
| සටහන 10.ආයෝජන | | | | | |
| **181.ස්ථාවර තැනපත්** | | | | | |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | | | | | |
| **ගි.අ.318031300002** | 500,000.00 | | | 500,000.00 | 500,000.00 |
| ජාතික ඉ.කි.බැංකුව-රත්නපුර | | | | | |
| **2-0010-01-8442-0** | 1,000,000.00 | | | 1,000,000.00 | 1,000,000.00 |
| ජාතික ඉ.කි.බැංකුව-ඇහැලියගොඩ | | | | | |
| **2/0917/01/89341** | 10,000,000.00 | | | 10,000,000.00 | 10,000,000.00 |
| ම.ජ.බැංකුව,ඇහැලියගොඩ | | | | | |
| **085600100013303-1** | 10,000,000.00 | | | 10,000,000.00 | 10,000,000.00 |
| **085-600100077770** | 5,000,000.00 | | | 5,000,000.00 | 5,000,000.00 |
| **085600100015328 7** | | 12,000,000.00 | | 12,000,000.00 | |
| ආපසු ගෙවියයුතු තැන්පත්(සේවක | 426,366.82 | 68,429.45 | 9,719.92 | 485,076.35 | 426,366.82 |
| එකතුව | **26,926,366.82** | **12,068,429.45** | **9,719.92** | **38,985,076.35** | **26,926,366.82** |

ලේකම්

වී.ආර්.සී.ජේ.ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

# 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ සටහන්

| විස්තරය | 2023.01.01 දිනට පිරිවැය | 2023 එකතු කිරීම | 2023 ඉවත් කිරීම | 2023.12.31.දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| සටහන -11 මුදල් හා මුදල් සමාන දෑ | | | | | |
| 191 .මහජන බැංකුව ජංගම ගිණුම-085 | 19,339,717.06 | 133,139,787.97 | 123,856,725.89 | 28,622,779.14 | 19,339,717.06 |
| 193. මහජන බැංකුව ඉතිරි කිරීමේ ගිණු | 1,251,119.66 | 109,539.34 | 0.00 | 1,360,659.00 | 1,251,119.66 |
| එකතුව | **20,590,836.72** | **133,249,327.31** | **123,856,725.89** | **29,983,438.14** | **20,590,836.72** |
| සටහන-12 ජංගම නොවන වගකීම් | | | | | |
| 221-දේශිය ණය සංවර්ධන අරමුදල | 8,412,586.74 | 5,763,488.00 | 714,036.94 | 13,462,037.80 | 8,412,586.74 |
| එකතුව | **8,412,586.74** | **5,763,488.00** | **714,036.94** | **13,462,037.80** | **8,412,586.74** |
| සටහන-13-ජංගම වගකීම් | | | | | |
| ආපසු ගෙවියයුතු සේවක ඇප තැන | 426,366.82 | 68,429.45 | 9,719.92 | 485,076.35 | 426,366.82 |
| 231 වියදම් ණය හිමියෝ | 18,077,727.67 | 6,284,073.25 | 9,029,850.04 | 15,331,950.88 | 18,077,727.67 |
| 222 දේශිය ණය සංවර්ධන අරමුදල | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 232 කර්මාන්ත ණය හිමියෝ | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 241 කලින් ලද ආදායම | 607,173.10 | 718,288.23 | 607,173.10 | 718,288.23 | 607,173.10 |
| 252 ආදායම් වෙනුවෙන් තැන්පත් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 253 පුස්තකාල තැන්පත් | 57,425.00 | 10,000.00 | 0.00 | 67,425.00 | 57,425.00 |
| 257 විවිධ තැන්පත් | 4,368,956.84 | 3,820,369.94 | 3,066,603.94 | 5,122,722.84 | 4,368,956.84 |
| එකතුව | **23,537,649.43** | **10,832,731.42** | **12,703,627.08** | **21,725,463.30** | **23,537,649.43** |
| සටහන-14 හිමිකම් | | | | | |
| 211 සමුච්චිත අරමුදල හා උණනා | 165,823,624.94 | 47,073,112.21 | 7,082,795.87 | 205,813,941.28 | 165,823,624.94 |
| 212 ප්‍රාග්ධන යෙදුමට ආදායමින් ද | 163,843,403.50 | 2,618,642.00 | 72,713.20 | 166,389,332.30 | 163,843,403.50 |
| එකතුව | **329,667,028.44** | **49,691,754.21** | **7,155,509.07** | **372,203,273.58** | **329,667,028.44** |

ලේකම්

වී.ආර්.සී.ජේ. ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය සාධන ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී
ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාව

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | | |
|---|---|---|
| 2022.01.01 දිනට මුදල් ශේෂය | | 20590836.72 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | | |
| 10.වර්පනම් හා බදු | 11,816,630.78 | |
| 20.කුලී | 12,088,896.09 | |
| 30.බලපත්‍ර ගාස්තු | 936,780.00 | |
| 40.සේවා සඳහා ගාස්තු | 2,345,964.43 | |
| 50.වරෙන්තු ගාස්තු හා දඩ | 828,290.03 | |
| 60.වෙනත් ආදායම් | 42,982,349.47 | |
| 70.ආදායම් ආධාර | 46,032,799.75 | |
| සේවක ණය | 4,525,321.34 | |
| අත්තිකාරම් | 2,052,030.41 | |
| මිශ්‍ර තැන්පත් | 3,830,369.94 | |
| සමුච්චිත අරමුදල | 48,680.00 | |
| ආදායම් හා වෙනත් ලැබීම | 2,351.70 | |
| | 127,490,463.94 | 148,081,300.66 |
| | | |
| අඩු කලා- | | |
| 1.වැටුප් හා දීමනා | 57,364,183.12 | |
| 2.ගමන් වියදම් | 1,294,462.50 | |
| 3.සැපයුම් හා උපකරණ | 12,623,136.40 | |
| 4.ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 6,163,284.01 | |
| 5.ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක සේවා | 6,394,885.20 | |
| 6.පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 948,211.10 | |
| 7.ආධාර මුදල් ආයක මුදල් හා සහනාධාර | 392,110.00 | |
| 8.විශ්‍රාම වැටුප් විශ්‍රාම දායක මුදල් හා සහනාධාර | 1,038,144.00 | |
| සේවක ණය | 7,876,278.00 | |
| අත්තිකාරම් | 1,924,500.53 | |
| මිශ්‍ර තැන්පත් | 3,066,603.94 | |
| සමුච්චිත අර මුදල | 76,471.00 | |
| විවිධ ණය හිමියෝ | 8,317,342.07 | |
| | 107,479,611.87 | 40,601,688.79 |
| මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| ආයෝජන ක්‍රියාකාරකම් | | |
| ස්ථාවර තැන්පත් | | |
| ස්ථාවර තැන්පත් පොලී | 3,020,679.09 | |
| ප්‍රාග්ධන වැය | 3,663,077.08 | |
| ආයෝජන | 12,000,000.00 | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | 12,642,397.99 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් | | 27,959,290.80 |
| 80.ප්‍රාග්ධන ලැබීම් | 2,738,184.28 | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| අඩු කලා - | | |
| 10. ණය ආපසු ගෙවීම | 714,036.94 | |
| සමස්ත ශුද්ධ මුදල් මුදල් ප්‍රවාහය | | 29,983,438.14 |

..............................

ටී. ආර්. [illegible] ගුණසේකර

ලේකම් හා

[illegible]

<u>ස්කන්ධය වෙනස් වීමේ සටහන</u>

| විස්තරය | සමුච්චිත අතිරික්තය/ඌණතාවය |
|---|---:|
| 2023.01.01 දිනට ශේෂය | 165,823,624.94 |
| පූර්ව කාල පරිච්ඡේදවල වැ | 8,825,348.55 |
| නැවත ප්‍රකාශ කල ශේෂය | **174,648,973.49** |
| වර්ෂයේ ගැළපීම | 1,484,393.21 |
| 2023 වර්ෂයේ ලැබීම | 48,680.00 |
| 2023 වර්ෂයේ ගෙවීම | 76,471.00 |
| 2023 වර්ෂයේ විස්තීර්ණ ආ | 29,708,365.58 |
| 2023.12.31 දිනට ශේෂය | **205,813,941.28** |

ලේකම්

ටී.ආර්.සී.කේ.ගුණසේකර
ලේකම් හා
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරී
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

## ඇහැලියගොඩ නගර සීමාවට අයත්,
## පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතනයන්හි
## දුරකථන නාමාවලිය

| | | |
|---|---|---|
| 01. | ඇහැලියගොඩ පොලිස් ස්ථානය | - 036-2258222 |
| 02. | ඇහැලියගොඩ මූලික රෝහල | - 036-2258261 |
| 03. | ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | - 036-2258278 |
| 04. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - 036-2258002 |
| 05. | කලාප අධ්‍යපන කාර්යාලය | - 036-2256159 |
| 06. | ඇහැලියගොඩ තැපැල් කාර්යාලය | - 036-2258250/0362259573 |
| 07. | ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය | - 045-2226888/0362259978 |
| 08. | විදුලි බල මණ්ඩල කලාප කාර්යාලය | - 036-2259980 |
| 09. | සතොස ඇහැලියගොඩ ශාඛාව | - 036-2257266 |
| 10. | ඇහැලියගොඩ ජාතික පාසල | - 036-2258266 |
| 11. | ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලය | - 036-2258306 |
| 12. | ලංකා බැංකුව ඇහැලියගොඩ ශාඛාව | - 036-2259571 |
| 13. | මහජන බැංකුව ඇහැලියගොඩ ශාඛාව | - 036-2258270/036-2259567 |
| 14. | කොමර්ෂල් බැංකුව ඇහැලියගොඩ ශාඛාව | - 036-2258992/036-2258993 |
| 15. | එන්.ඩී.බී බැංකුව ඇහැලියගොඩ ශාඛාව | - 036-7448003/0367448004 |
| 16. | එච්.එස්.බී බැංකුව ඇහැලියගොඩ ශාඛාව | - 036-2259099 |
| 17. | ආර්.ඩී.බී බැංකුව ඇහැලියගොඩ ශාඛාව | - 036-2258331 |
| 18. | කීල්ස් සුපර් ආයතනය | - 036-2256024/076-5835884 |
| 19. | කාර්ගිල්ස් ෆුඩ් සිටි ආයතනය | - 036-2259946/036-2259947 |
| 20. | සිපෙට්කෝ ඉන්ධන පිරවුම්හල | - 077-7737755 |